62604

සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

33 S I

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2010 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர(உயர் தர)ப் பரீட்சை, 2010 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2010

ගිණුම්කරණය I
கணக்கீடு I
**Accounting I**

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

විභාග අංකය ..............................

පරීක්ෂකගේ ප්‍රයෝජනය සඳහා පමණි.

| I කොටස සඳහා | |
|---|---|
| ප්‍රශ්න අංක | ලැබූ ලකුණු |
| 1 - 20 | |
| 21 - 40 | |
| එකතුව | |

**අයදුම්කරුවන්ට උපදෙස් :**

※ I කොටසේ ප්‍රශ්න **සියල්ලට ම මෙම ප්‍රශ්න පත්‍රයේ ම** පිළිතුරු සපයන්න. සෑම ප්‍රශ්නයකට ම ලකුණු **01** බැගින් හිමි වේ.

※ I කොටසේ පිළිතුරු පත්‍රය II කොටසේ පිළිතුරු පත්‍රය සමඟ **එකට අමුණා** භාර දෙන්න.

## I කොටස

● අංක **1** සිට **20** තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේ දී **වඩාත් නිවැරදි පිළිතුර** පෙරටු ව ඇති **කොටුව තුළ "✓" ලකුණ** යොදන්න. උද : ✓

1. 2009.04.01 දින සමාගමක් රු. 800 000 කට උපකරණ ණයට අත්පත්කර ගන්නා ලදී. මෙම උපකරණ 2010.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පිරිවැය මත 10% ක් ක්ෂය කරන ලදී. මෙම ගනුදෙනුවල බලපෑම පහත සඳහන් **කුමන සමීකරණය** මඟින් පෙන්නුම් කරයි ද?

| | **වත්කම්** | = | **වගකීම්** | + | **හිමිකම** |
|---|---|---|---|---|---|
| (1) | +800 000 | = | +880 000 | − | 80 000 |
| (2) | +800 000 | = | +720 000 | + | 80 000 |
| (3) | +720 000 | = | +800 000 | − | 80 000 |
| (4) | +720 000 | = | +720 000 | | − |
| (5) | +720 000 | = | − | | +720 000 |

2. ව්‍යාපාර ආයතනයක් සම්බන්ධව පහත දී ඇති තොරතුරු අතුරෙන් කුමන තොරතුරට වෙළඳ ණයහිමියන් වැඩිපුර ඇල්මක් දක්වයි ද?
   - (1) වාර්ෂික ලාභාංශ
   - (2) වර්ෂය සඳහා ලාභය
   - (3) නියමිත කාලයේ දී ණය ගෙවීමේ හැකියාව
   - (4) ව්‍යාපාර ආයතනය ප්‍රතිසංවිධානය කිරීමේ හැකියාව
   - (5) ප්‍රත්‍යාගණන අතිරික්තය

3. පහත සඳහන් කුමන මූල්‍ය ප්‍රකාශන සංරචකය / සංරචකයන් නිශ්චිත දිනකට පිළියෙල කරනු ලබන්නේ ද?

   A - ශේෂ පත්‍රය B - ආදායම් ප්‍රකාශනය
   C - හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය D - මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

   - (1) A පමණි.
   - (2) C පමණි.
   - (3) A හා C පමණි.
   - (4) B හා D පමණි.
   - (5) A,B හා D පමණි.

[ දෙවැනි පිටුව බලන්න.

4. ගිණුම් කාලපරිච්ඡේදයක් තුළ ගැතිලි සහ අමතර ප්‍රාග්ධනය හඳුන්වාදීමක් නොමැති විට එම කාලපරිච්ඡේදය සඳහා ව්‍යාපාර ආයතනය නියත වශයෙන් ම ලාභයක් පෙන්නුම් කරනුයේ පහත සඳහන් කුමන අවස්ථාවේ දී ද?

(1) කාලපරිච්ඡේදය තුළ මුළු වත්කම් වැඩිවන අවස්ථාවක
(2) කාලපරිච්ඡේදය තුළ මුළු වගකීම් වැඩිවන අවස්ථාවක
(3) කාලපරිච්ඡේදය අවසානයේ දී මුළු වගකීම්වලට වඩා මුළු වත්කම් වැඩිවන අවස්ථාවක
(4) කාලපරිච්ඡේදය අවසානයේ දී කාරක ප්‍රාග්ධනය අඩුවන අවස්ථාවක
(5) මුළු වගකීම්වල වැඩිවීමට වඩා මුළු වත්කම්වල වැඩිවීම වැඩිවන අවස්ථාවක

5. පහත ගිණුම්කරණ සමීකරණ අතුරෙන් කුමන සමීකරණ නිවැරදි වන්නේ ද?

A. ශුද්ධ වත්කම් = හිමිකම්
B. වත්කම් + ආදායම් = හිමිකම් + වගකීම් + වියදම්
C. වත්කම් + වියදම් = හිමිකම් + වගකීම් + ආදායම්
D. ශුද්ධ වත්කම් = මුළු වත්කම් – ජංගම නොවන වගකීම් – ජංගම වගකීම්

(1) B හා C පමණි.
(2) B, C හා D පමණි.
(3) A, C හා D පමණි.
(4) A, B හා C පමණි.
(5) A, B, C හා D යන සියල්ලම ය.

6. ගිණුම්කරණ ක්‍රියාවලියේ දී පහත සඳහන් කාර්යයන් සිදුකරනු ලබන නිවැරදි අනුපිළිවෙළ කුමක් ද?

A. පියවීම් සටහන් පිළියෙල කිරීම
B. ලෙජරයට ගනුදෙනු පිටපත් කිරීම
C. ජ'නල්වල ගනුදෙනු වාර්තා කිරීම
D. මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම

(1) C, A, B, D
(2) D, C, A, B
(3) B, A, D, C
(4) C, B, A, D
(5) C, B, D, A

ඉ-තක්සලාව The National e-learning Portal for The General Education

7. 2010.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිෂ්පාදන ආයතනයක් පහත සඳහන් තොරතුරු සපයා ඇත.

| | රු. |
|---|---|
| නොනිමි තොග - 2009.04.01 දිනට | 7 000 |
| - 2010.03.31 දිනට | 10 000 |
| භාවිත කරන ලද සෘජු ද්‍රව්‍ය | 3 000 |
| සෘජු ශ්‍රමය | 2 000 |
| කම්හල් පොදුකාර්ය | 2 000 |

නිෂ්පාදනය කළ භාණ්ඩවල පිරිවැය කොපමණ ද?

(1) රු. 3 000
(2) රු. 4 000
(3) රු. 5 000
(4) රු. 6 000
(5) රු. 7 000

[ තුන්වැනි පිටුව බලන්න.

අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

8. තනි ව්‍යාපාරයක පහත සඳහන් තොරතුරු ඇසුරෙන් 2010.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ඉපයූ ලාභය කොපමණ ද?

2009.04.01 දිනට හිමිකම රු. 500 000 කි.

2010.03.31 දිනට මුළු වත්කම් සහ මුළු වගකීම් පිළිවෙළින් රු. 800 000 ක් සහ රු. 200 000 ක් විය.

වර්ෂය තුළ ගැනිලි රු. 30 000 කි.

(1) රු. 100 000
(2) රු. 130 000
(3) රු. 160 000
(4) රු. 500 000
(5) රු. 600 000

9. ආයතනයක පහත දී ඇති තොරතුරු මත 2010.03.31 දිනට ශේෂ පත්‍රයේ පෙන්නුම් කළ යුතු මුදල් ශේෂය කොපමණ ද?

| | රු. |
|---|---|
| 2010.03.31 දිනට බැංකු ප්‍රකාශනයට අනුව අයිරාව | (10 000) |
| තැන්පත් කළ නමුත් 2010.03.31 දිනට උපලබ්ධි නොවූ චෙක්පත් | 45 000 |
| නිකුත් කළ නමුත් 2010.03.31 දිනට ගෙවීම් සඳහා බැංකුවට ඉදිරිපත් නොකළ චෙක්පත් | 30 000 |
| ණයගැතියන් විසින් සෘජුව ම බැංකුවේ තැන්පත් කළ චෙක්පත් | 15 000 |

(1) රු. 5 000
(2) රු. (20 000)
(3) රු. 25 000
(4) රු. (25 000)
(5) රු. (40 000)

● පහත තොරතුරු යොදා ගනිමින් අංක **10** සහ **11** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

ආයතනයක් විසින් 2010.03.31 දින පිරිවැය රු. 42 000 ක් වූ සහ එදිනට සමුච්චිත ක්ෂය රු. 28 000 ක් වූ යන්ත්‍රයක් ඒ හා සමාන වෙනත් යන්ත්‍රයක් සමඟ හුවමාරු කරන ලදී. පැරණි යන්ත්‍රයේ ධාරණ වටිනාකම එහි හුවමාරු අගය ලෙස එකඟ වී ඇත. නව යන්ත්‍රයේ හුවමාරු වටිනාකම රු. 44 000 ක් වූ අතර වෙනස මුදලින් ගෙවන ලදී.

10. මෙම හුවමාරුව සම්බන්ධයෙන් පහත කුමන ප්‍රකාශනය නිවැරදි වේ ද?

(1) රු. 12 000 ක අලාභයක් ඇතිවේ.
(2) රු. 14 000 ක ලාභයක් ඇතිවේ.
(3) රු. 14 000 ක අලාභයක් ඇතිවේ.
(4) රු. 30 000 ක අලාභයක් ඇතිවේ.
(5) ලාභයක් හෝ අලාභයක් ඇති නොවේ.

11. මෙම හුවමාරුව නිසා ආයතනයේ යන්ත්‍රවල ධාරණ වටිනාකමෙහි ඇතිවන ශුද්ධ වැඩිවීම කොපමණ ද?

(1) රු. 14 000
(2) රු. 28 000
(3) රු. 30 000
(4) රු. 42 000
(5) රු. 44 000

12. යන්ත්‍ර විකුණන සමාගමක් පිරිවැය රු. 1 800 000 ක් වූ යන්ත්‍රයක් 2010 මාර්තු මස 01 දින රු. 2 000 000 කට විකුණන ලදී. මෙම ගනුදෙනුව පියවීමේ දී රු. 300 000 ක එකඟ වූ මිලකට පාවිච්චි කරන ලද යන්ත්‍රයක් සහ රු. 700 000 ක මුදලක් ගැනුම්කරුගෙන් ලබාගන්නා ලදී. ඉතිරිය මාස තුනක් ඇතුළත ගෙවීමට ගැනුම්කරු එකඟ විය.
2010.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මෙම ගනුදෙනුවට අදාළව හඳුනාගත යුතු සමාගමේ ආදායම කුමක් ද?

(1) රු. 300 000
(2) රු. 700 000
(3) රු. 1 000 000
(4) රු. 1 800 000
(5) රු. 2 000 000

[ හතරවැනි පිටුව බලන්න.

13. මෝටර් රථ වෙළඳම් කරන ආයතනයක් 2010 මැයි 30 දින පාවිච්චි කරන ලද මෝටර් රථයක් රු. 1 300 000 කට මිලදී ගෙන තැරැව්කරුගේ කොමිස් ලෙස රු. 20 000 ක් ගෙවන ලදී. ආනයන බදුවල ක්ෂණික අඩුවීම නිසා 2010 ජූනි 30 දිනට මෙම රථයේ වෙළඳපොළ මිල රු. 800 000 කට ඇස්තමේන්තු කරන ලදී. තව ද එදිනට මෙම රථයේ ඇස්තමේන්තු විකුණුම් කොමිස් මුදල රු. 30 000 ක් වේ.
2010 ජූනි 30 දිනට මෙම රථයේ පිරිවැය සහ ශුද්ධ උපලබ්ධි අගය වනුයේ පිළිවෙළින්

(1) රු. 1 300 000 සහ රු. 770 000 කි.
(2) රු. 1 320 000 සහ රු. 780 000 කි.
(3) රු. 1 000 000 සහ රු. 830 000 කි.
(4) රු. 1 320 000 සහ රු. 770 000 කි.
(5) රු. 1 320 000 සහ රු. 800 000 කි.

14. පහත සඳහන් ප්‍රකාශවලින් කුමන ප්‍රකාශය / ප්‍රකාශ උපචිත ගිණුම්කරණය සම්බන්ධයෙන් නිවැරදි වන්නේ ද?
A. වියදම් සඳහා වන මුදල් ගලා යැම්වලට වඩා ආදායම් මඟින් ඇතිවන මුදල් ගලා ඒම්වල අතිරික්තය, ශුද්ධ ලාභය වේ.
B. කාලච්ඡේදයක් සඳහා ආදායම් හඳුනාගනු ලබන්නේ එය උපයන විට ය.
C. කාර්ය සාධනය මැනීම සඳහා මුදල් පදනමට වඩා උපචිත පදනම යෝග්‍ය වේ.

(1) A පමණි.
(2) B පමණි.
(3) C පමණි.
(4) A සහ B පමණි.
(5) B සහ C පමණි.

15. ගිණුම් වර්ෂයක් අවසානයේ දී පිළිවෙළින් ශේෂ පියවනු ලබන්නේ සහ ඉදිරියට ගෙනයනු ලබන්නේ පහත සඳහන් කුමන ගිණුම් වර්ග යුගලයේ ද?

| | පියවන | ඉදිරියට ගෙනයන |
|---|---|---|
| (1) | වත්කම් | වියදම් |
| (2) | වියදම් | වත්කම් |
| (3) | වගකීම් | ආදායම් |
| (4) | ආදායම් | වියදම් |
| (5) | හිමිකම් | වියදම් |

16. අනූ, ධනූ සහ මදූ ලාභාලාභ සමානව බෙදාගනිමින් පවත්වාගෙන යන හවුල් ව්‍යාපාරයක හවුල්කරුවන් ය. අනූ 2010 මාර්තු 31 දින හවුල් ව්‍යාපාරයෙන් විශ්‍රාමගත් අතර එදිනට ව්‍යාපාරයේ කීර්තිනාමය ප්‍රාග්ධන ගිණුම්වල ගළපන ලදී. හවුල් ව්‍යාපාරය අඛණ්ඩව පවත්වාගෙන යාමට ධනූ සහ මදූ තීරණය කරන ලදී.

| ප්‍රාග්ධන ගිණුම් ශේෂ : | ධනූ (රු.) | මදූ (රු.) |
|---|---|---|
| කීර්තිනාමය ගැළපීමට පෙර | 200 000 | 150 000 |
| කීර්තිනාමය ගැළපීමෙන් පසු | 160 000 | 140 000 |

හවුල්කරුවන් විසින් එකඟ වූ මුළු කීර්තිනාම වටිනාකම කුමක් ද?

(1) රු. 10 000
(2) රු. 25 000
(3) රු. 50 000
(4) රු. 75 000
(5) රු. 150 000

[ පස්වැනි පිටුව බලන්න.

අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

Past Papers Wiki

17. නිමල් සහ බාලා සම සමව ලාභාලාභ බෙදගන්නා හවුල්කරුවන් ය. බාලාට අවම වාර්ෂික ආදායමක් හවුල් ව්‍යාපාරයෙන් ලැබෙන බවට නිමල් විසින් සහතික වී තිබිණි. ඉහත එකඟතාව අනුව එක් වර්ෂයක් සඳහා වූ ලාභය නිමල් සහ බාලා අතර බෙදගෙන ඇති ආකාරය පහත දක්වේ.

| | රු. | රු. |
|---|---|---|
| වර්ෂය සඳහා ලාභ | | 900 000 |
| ලාභ කොටස් - නිමල් | 400 000 | |
| - බාලා | 500 000 | 900 000 |

නිමල් විසින් බාලාට සහතික කොට තිබූ වාර්ෂික ආදායම කොපමණ ද?

(1) රු. 50 000
(2) රු. 100 000
(3) රු. 400 000
(4) රු. 500 000
(5) රු. 900 000

18. සම සමව ලාභාලාභ බෙදගනිමින් පබා සහ නිෂා විසින් පවත්වාගෙන ගිය හවුල් ව්‍යාපාරයට 2009 සැප්තැම්බර් 30 දින සුභා 1/3 ක ලාභාලාභ කොටසකට සහ රු. 10 000 ක මාසික වේතනයකට එකඟව හවුල්කාරියක ලෙස සම්බන්ධ විය. 2010.03.31 දිනෙන් අවසන් වර්ෂය තුළ දී ඒකාකාරීව උපයන ලද ලාභය රු. 600 000 ක් විය.

2010.03.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පබා සහ සුභා හවුල් ව්‍යාපාරයෙන් ලබාගත් ආදායම් වනුයේ පිළිවෙළින්

(1) රු. 80 000 සහ රු. 140 000 කි.
(2) රු. 100 000 සහ රු. 100 000 කි.
(3) රු. 230 000 සහ රු. 140 000 කි.
(4) රු. 230 000 සහ රු. 150 000 කි.
(5) රු. 240 000 සහ රු. 150 000 කි.

● පහත තොරතුරු යොදගනිමින් අංක **19** සහ **20** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

2010 ජූනි මාසය සඳහා සමාගමක වැටුප් සාරාංශය පහත දී ඇත.

| **විස්තරය** | රු. |
|---|---|
| මූලික වැටුප | 100 000 |
| දීමනා | 25 000 |
| සේවක අර්ථසාධක අරමුදල් අඩු කිරීම් | 8 000 |
| උත්සව අත්තිකාරම් අඩුකිරීම් | 7 000 |
| ශුද්ධ වැටුප | 110 000 |
| සේව්‍ය අර්ථසාධක අරමුදල් දයකය | 12 000 |

The National e-learning Portal by The General Education

19. ජූනි මාසය සඳහා සමාගමේ සේවකයින්ට අදළ මුළු වියදම කොපමණ ද?

(1) රු. 100 000
(2) රු. 108 000
(3) රු. 110 000
(4) රු. 125 000
(5) රු. 137 000

20. පහත සඳහන් ඒවායින් කුමන සටහන ජූනි මාසය සඳහා සේවක අර්ථසාධක අරමුදල් වියදම් සම්බන්ධව නිවැරදි ගිණුම්කරණ සටහන පෙන්නුම් කරයි ද?

| | සේ.අ.අ. වියදම් ගිණුම (හර) රු. | වේතන ගිණුම (හර) රු. | ගෙවිය යුතු සේ.අ.අ. ගිණුම (බැර) රු. |
|---|---|---|---|
| (1) | 8 000 | 8 000 | 16 000 |
| (2) | 8 000 | - | 8 000 |
| (3) | 12 000 | 12 000 | 24 000 |
| (4) | 12 000 | - | 12 000 |
| (5) | 12 000 | 8 000 | 20 000 |

● ප්‍රශ්න අංක **21** සිට **35** දක්වා කෙටි පිළිතුරු සපයන්න.

21. ව්‍යාපාර ආයතනයක අයිතිකරු ඔහුගේ නිවස අළුත්වැඩියා කිරීම සඳහා ලබාගත් බැංකු ණය ව්‍යාපාරයේ වගකීම් යටතේ ඇතුළත් කිරීමෙන් කඩවන ගිණුම්කරණ සංකල්පය සඳහන් කරන්න.

..........................................................................................

22. සාමාන්‍ය මිල මට්ටම් අඛණ්ඩව ඉහළ යමින් තිබෙන අවස්ථාවක මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය පදනම මත පිළියෙල කිරීමෙන් බලපෑමක් ඇතිවන ගිණුම්කරණ තොරතුරුවල ගුණාත්මක ලක්ෂණයක් සඳහන් කරන්න.

..........................................................................................

23. රු. 21 000 ක් වූ විකුණුම් ඉන්වොයිසියක් විකුණුම් ජ'නලයේ රු. 12 000 ක් ලෙස වාර්තා කොට පොදු ලෙජරයට ද පිටපත් කොට ඇත.

(අ) ඉහත වැරද්ද නිවැරදි කිරීමට අවශ්‍ය ජ'නල් සටහන ලියන්න. (සංලක්ෂ්‍යය අවශ්‍ය නොවේ.)

..........................................................................................

..........................................................................................

(ආ) මෙම නිවැරදි කිරීම **නොකළහොත්** ලාභයට වන බලපෑම කොපමණදැයි නිර්ණය කර එය වැඩිවීමක් ද, අඩුවීමක් ද නැතහොත් වෙනස් නොවේ ද යන්න සඳහන් කරන්න.

**අඩුවේ / වැඩිවේ / වෙනස් නොවේ**

රු. .................................................. ..................................................

24. සමාගමක් යන්ත්‍රයක් මිලදීගෙන එය කර්මාන්ත ශාලාවේ සවිකරන තෙක් පහත සඳහන් වියදම් දරා ඇත.

| | රු. |
|---|---|
| මිලදී ගැනුම් වටිනාකම | 900 000 |
| කර්මාන්තශාලාව තෙක් ප්‍රවාහන වියදම් | 10 000 |
| ස්ථානගත කිරීමේ වියදම | 40 000 |
| ප්‍රවාහනයේ දී වේග සීමාව ඉක්මවා රිය පැදවීම නිසා උසාවිය විසින් පනවන ලද දඩ මුදල | 5 000 |
| යන්ත්‍ර ස්ථානගත කිරීමේ දී කර්මාන්තශාලා බිත්තියට සිදු වූ හානිය අළුත්වැඩියා කිරීමේ පිරිවැය | 45 000 |

මෙම යන්ත්‍රයෙහි මූලික පිරිවැය කොපමණ ද?

රු. ..................................................

[ හත්වැනි පිටුව බලන්න.

අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

25. දී ඇති ගිණුම්කාල පරිච්ඡේදයක දී වත්කමක ක්ෂය වටිනාකමට පහත එකිනෙක සාධකය බලපාන්නේ ද නැද්ද යන්න (✓) ලකුණ යොදා සඳහන් කරන්න.

| සාධකය | බලපායි | බල නොපායි |
|---|---|---|
| 1. ඇස්තමේන්තුගත ඵලදායී ජීවිත කාලය | .................... | .................... |
| 2. නඩත්තු පිරිවැය | .................... | .................... |
| 3. ඇස්තමේන්තුගත සුන්බුන් අගය | .................... | .................... |
| 4. ක්ෂය ක්‍රමය | .................... | .................... |

26. පහත තොරතුරු ආයතනයක කාර්යාලයීය ලිපිද්‍රව්‍යවලට අදාළ වේ.

| | රු. |
|---|---|
| 2009.04.01 දිනට ලිපිද්‍රව්‍ය තොග | 6 000 |
| වර්ෂය තුළ මිලදී ගත් ලිපිද්‍රව්‍ය | 30 000 |
| 2010.03.31 දිනට පාවිච්චි නොකළ හොඳ තත්ත්වයේ පවතින ලිපිද්‍රව්‍ය | 4 000 |
| වර්ෂය තුළ හානි වූ ලිපිද්‍රව්‍ය | 1 000 |
| හානි වූ මුළු ලිපිද්‍රව්‍ය තොගය විකුණා ලද මුදල | 300 |

වර්ෂය සඳහා මුළු කාර්යාලයීය ලිපිද්‍රව්‍ය වියදම නිර්ණය කරන්න.

රු. ............................................................

27. 2010.03.31 දින කලු සහ සුදු හවුල් ව්‍යාපාරයට රතු බඳවාගැනීමත් සමඟ ජංගම නොවන වත්කම් ප්‍රත්‍යාගණනය කිරීම නිසා ශුද්ධ වත්කම් රු. 600 000 සිට රු. 1 000 000 දක්වා වැඩි විය. රතු, තම ප්‍රාග්ධන කොටස ලෙස රු. 200 000 ක් එදිනම රැගෙන එන ලදී. 2010.03.31 දිනට කලු සහ සුදුගේ ජංගම ගිණුම් ශේෂයන්ගේ එකතුව රු. 300 000 ක් විය. 2010 මාර්තු 31 දිනට නව හවුල් ව්‍යාපාරයේ හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන ගිණුම් ශේෂයන්ගේ එකතුව සහ මුළු ශුද්ධ වත්කම් ගණනය කර දක්වන්න.

(අ) ප්‍රාග්ධන ගිණුම් ශේෂ එකතුව : රු. ..............................................

(ආ) මුළු ශුද්ධ වත්කම් : රු. ..............................................

28. හවුල්කරුවන්ගේ ප්‍රාග්ධනය සඳහා වර්ෂයකට 10% ක පොලියක් හිමි බව හවුල් ගිවිසුමෙහි සඳහන් වේ. ඉවත්වී යන හවුල්කරු වන පියල් ඔහුට හිමි මුදල ඔහු ඉවත්වීමත් සමඟම පියවන්නේ නැත්නම් ඉහත වගන්තිය යටතේ 10% ක පොලියක් ඔහුට ගෙවන මෙන් අනෙක් හවුල්කරුවන්ට බලකර සිටියි.
පියල්ට හිමි මුදල ඔහු ඉවත්ව යන විට නොගෙවා සිටියහොත් ඔහුට 10% ක පොලියක් ලබාගැනීමට අයිතියක් ඇත්ද යන්න හේතු සහිතව සඳහන් කරන්න.

..........................................................................................................................

..........................................................................................................................

29. වත්කම් සහ වගකීම් ශේෂ පත්‍රයක ජංගම සහ ජංගම නොවන ලෙස වර්ග කිරීමට පදනම් වන ගිණුම්කරණ සංකල්පය දක්වන්න.

..........................................................................................................................

30. වත්කමක් මූල්‍ය ප්‍රකාශනවල හඳුනාගැනීමට සම්පූර්ණ කළ යුතු අත්‍යවශ්‍ය නිර්ණායක **දෙකක්** සඳහන් කරන්න.

1. ..........................................................................................................................

2. ..........................................................................................................................

31. රු. 10 000 ක ණයගැති ශේෂයක් සම්පූර්ණයෙන් පියවීම සඳහා ණයගැතියකුගෙන් රු. 8 000 ක් භාරගන්නා ලදී. මෙම ගනුදෙනුව වාර්තා කිරීම සඳහා අවශ්‍ය ජර්නල් සටහන මුදල් ද ඇතුළුව ලියන්න. (සංක්ෂිප්තය අවශ්‍ය නොවේ.)

..........................................................................................................................

..........................................................................................................................

..........................................................................................................................

[ අටවැනි පිටුව බලන්න.

32. 2010.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපාර ආයතනයක පහත සඳහන් තොරතුරු දී ඇත.

| | (රු. '000) |
|---|---|
| ණයට විකුණුම් | 500 000 |
| ණයගැතියන්ගෙන් එකතු කරගත් මුදල් | 490 000 |

ණයගැතියන් සඳහා බොල් හා අඩමාන ණය වෙන්කිරීම සෑම ගිණුම් වර්ෂයක් අවසානයේ වූ වටිනාකම මත 1% ක් වෙන්කිරීම ප්‍රතිපත්තිය වේ.
2010.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා බොල්ණය සහ අඩමාන ණය වියදම ගණනය කර දක්වන්න.

රු. ..........................................................

33. පහත සඳහන් එකිනෙක ගනුදෙනුව වාර්තා කිරීමට අදාළ මූලික පොත සහ මූලාශ්‍ර ලේඛනය සඳහන් කරන්න.

| ගනුදෙනුව | මූලික පොත | මූලාශ්‍ර ලේඛනය |
|---|---|---|
| (1) අයිතිකරු විසින් ප්‍රාග්ධනය ලෙස මුදල් හඳුන්වා දීම | ................................ | ................................ |
| (2) ණයට මිලදී ගත් භාණ්ඩ ආපසු යැවීම | ................................ | ................................ |
| (3) ලිපිද්‍රව්‍ය ණයට මිලදී ගැනීම | ................................ | ................................ |
| (4) අඩමාන ණය සඳහා වෙන්කිරීම | ................................ | ................................ |

34. ව්‍යාපාර ආයතනයක් 2009.03.31 දිනට ධාරණ වටිනාකම ශුන්‍ය ව තිබූ පාවිච්චි කරන ලද මෝටර් රථයක් 2009.09.30 දින රු. 150 000 කට විකුණා එදින ම රු. 500 000 කට නව මෝටර් රථයක් අත්පත් කරගන්නා ලදී. මෝටර් රථ සඳහා පිරිවැය මත වර්ෂයකට 20% ක් ක්ෂය සඳහා වෙන් කරනු ලැබේ.

(අ) මෙම ගනුදෙනු නිසා 2010.03.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ක්ෂයවීම්වල වැඩිවීම ගණනය කර දක්වන්න.

රු. ..........................................................

(ආ) මෝටර් රථය විකිණීම මගින් ඇතිවූ ලාභය හෝ අලාභය ගණනය කර දක්වන්න.

රු. ..........................................................

35. ගිණුම් වර්ෂයක් අවසානයේ දී මුදල් පොතේ ශේෂය බැංකු ප්‍රකාශනයේ ශේෂය සමඟ සමාන වේ නම් බැංකු සැසඳුම් ප්‍රකාශනයක් පිළියෙල කිරීම අවශ්‍ය ද යන්න හේතුවක් සමඟ සඳහන් කරන්න.

..........................................................................................................

..........................................................................................................

● ප්‍රශ්න අංක 36 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති ප්‍රකාශ **සත්‍ය** හෝ **අසත්‍ය** බව සඳහන් කරන්න.

36. මූල්‍ය ප්‍රකාශනවල සියලු ම සංරචකයන් උපචිත පදනම මත පිළියෙල කෙරේ. (...............)

37. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 5 ට අනුව, සාමාන්‍ය ව්‍යාපාර කාර්යයේ දී විකිණීම සඳහා වන, නිෂ්පාදන ක්‍රියාවලියෙහි පවතින වත්කම්, තොගවල ඇතුළත් නොවේ. (...............)

38. විකිණීමේ හෝ ආපසු එවීමේ පදනම මත යැවූ භාණ්ඩ ආදායම ලෙස හඳුනාගත යුත්තේ ඒවා නියෝජිතයා වෙත යැවූ අවස්ථාවේ දී ය. (...............)

39. ක්ෂය කළ හැකි වත්කමක සුන්බුන් අගය එහි ක්ෂය කළ හැකි වටිනාකමට වඩා වැඩිවන විට වත්කම් ක්ෂය කිරීම අවශ්‍ය නොවේ. (...............)

40. සියලු ම ව්‍යාපාර ආයතන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව කටයුතු කිරීම අනිවාර්ය වේ. (...............)

* *

[ නවවැනි පිටුව බලන්න.

අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

62609

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

33 S I

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2010 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர(உயர் தர)ப் பரீட்சை, 2010 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2010

ගිණුම්කරණය I (II කොටස)
கணக்கீடு I (பகுதி II)
Accounting I (Part II)

**අයදුම්කරුවන්ට උපදෙස් :**

* **පළමුවන** ප්‍රශ්නයට සහ තවත් ප්‍රශ්න **හතරකට** පමණක් පිළිතුරු සපයන්න.
* සෑම ප්‍රශ්නයකට ම පිළිතුරු ලිවීම **අලුත් කඩදාසියකින්** ආරම්භ කරන්න.
* අදාළ පෙරවැඩ, පිළිතුරු පත්‍රය සමඟ අමුණන්න.

**1.** අනුර සහ සෙනුර හවුල් ව්‍යාපාරයට 2009 ඔක්තෝබර් 01 දින වෙනුර සම්බන්ධ වූ අතර පහත තොරතුරු සපයා ඇත.

(i) වෙනුර හවුල් ව්‍යාපාරයට සම්බන්ධවීමේ දී එකඟ වූ කොන්දේසි :

* හවුල්කරුවන් ලාභාලාභ සමානව බෙදාගනියි.
* හවුල්කරුවන්ට ප්‍රාග්ධනය මත පොලී සඳහා හිමිකම් නැත.
* අනුර, සෙනුර සහ වෙනුර පිළිවෙළින් රු. 5 000 ක, රු. 3 000 ක සහ රු. 2 000 ක මාසික වැටුප් ලැබීමට නියමිත ය.
* හවුල්කරුවන් විසින් දෙනු ලබන ණය සඳහා වාර්ෂිකව 10% ක පොලියක් ගෙවිය යුතු ය. කලින් ලබාගත් ණය සඳහා ද නව අනුපාතය මෙදින සිට අදාළ වේ.
* පහත සඳහන් ගෙවීම් මගින් වෙනුර ප්‍රාග්ධනයට දයක විය යුතු ය.
  - හවුල් ව්‍යාපාරය සෙනුරගෙන් ලබාගත් ණයවලින් කොටසක් පියවීම සඳහා රු. 300 000 ක් ඔහුට ලබාදීම
  - මුදලින් ව්‍යාපාරයට රු. 200 000 ක් ලබාදීම
* 2009 ඔක්තෝබර් 01 දින හවුල් ව්‍යාපාරයේ කීර්තිනාමය රු. 300 000 ක් ලෙස ඇස්තමේන්තු කළ යුතු අතර කීර්තිනාම ගිණුමක් ලෙජරයේ පවත්වා නොගනියි.
* 2009 ඔක්තෝබර් 01 දින ඉඩම්වල ධාරණ වටිනාකම රු. 160 000 කින් වැඩි කිරීම.
* කීර්තිනාමය සහ ඉඩම්වල ධාරණ වටිනාකම වැඩිවීම හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන ගිණුම් තුළින් ගැළපිය යුතු ය.
* 2009 ඔක්තෝබර් 01 දින රු. 15 000 ක් අඩමාන ණය සඳහා වෙන් කළ යුතු අතර එය වෙනුර ව්‍යාපාරයට සම්බන්ධ වීමට පෙර කාලයට අදාළ වියදමක් ලෙස හඳුනාගත යුතු ය.

(ii) ඉහත එකඟ වූ පරිදි වෙනුර විසින් 2009 ඔක්තෝබර් 01 දින ණය පියවන ලද අතර මුදල් ද රැගෙන එන ලදී. කෙසේ නමුත් ප්‍රාග්ධනය ලෙස ගිණුම්ගත කර ඇත්තේ වෙනුර විසින් ව්‍යාපාරයට රැගෙන ආ මුදල පමණක් වන අතර සෙනුරගේ ණය පියවීම සම්බන්ධව කිසිදු ගිණුම්කරණ සටහනක් තබා නොමැත. එබැවින්, සෙනුරගෙන් ලබාගත් මුළු ණය මත අදාළ පොලිය 20% අනුපාතයට ගණනය කර ගිණුම්ගත කර ඇත.

(iii) සෙනුරට අයත් ව්‍යාපාරික ස්ථානයක් මාසයකට රු. 7 500 ක කුලියක් යටතේ හවුල් ව්‍යාපාරය සඳහා භාවිත කරයි.

(iv) වෙනුර ව්‍යාපාරයට ඇතුළත්වීමේ දී එකඟ වූ කොන්දේසි නොසලකා හරිමින් 2010 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇත. **අනුර** සහ **සෙනුර** අතර **පමණක්** ඔවුන් විසින් පෙර එකඟ වූ ගිවිසුම මත වර්ෂයේ ලාභය විසර්ජනය කර ඇත.

(v) 2010 මාර්තු 31 දිනට ශේෂ පත්‍රය :

| | | (රු. '000) |
|---|---|---|
| **වත්කම්** | | |
| දේපල, පිරියත සහ උපකරණ | | 1 340 |
| ආයෝජන | | 400 |
| ජංගම වත්කම් | | 760 |
| **මුළු වත්කම්** | | **2 500** |
| ප්‍රාග්ධන ගිණුම් : | අනුර | 800 |
| | සෙනුර | 600 |
| | වෙනුර | 200 |
| ජංගම ගිණුම් : | අනුර | 30 |
| | සෙනුර | 160 |
| | වෙනුර (හර) | (20) |
| ණය - සෙනුර | | 500 |
| ජංගම වගකීම් | | 230 |
| **හිමිකම් සහ මුළු වගකීම්** | | **2 500** |

[ දහවැනි පිටුව බලන්න.

(vi) සෙනුරගෙන් ණය මුදල ලබාගෙන ඇත්තේ 2009 අප්‍රේල් 01 දින වර්ෂයකට 20% පොලී අනුපාතය යටතේ ය.

(vii) 2010 මාර්තු 30 වන දින හානි වූ, පිරිවැය රු. 5 000 ක තොග ද ශේෂ පත්‍රයේ පෙන්වන ජංගම වත්කම්වල ඇතුළත් වේ.

(viii) හවුල්කරුවන්ගේ ජංගම ගිණුම් :

| | අනුර රු. | සෙනුර රු. | වෙනුර රු. | | අනුර රු. | සෙනුර රු. | වෙනුර රු. |
|---|---|---|---|---|---|---|---|
| 2009.04.01 දින ඉ.ගෙ.ආ ශේෂය | 20 000 | 10 000 | | 2009.04.01 දින මුදල් | | 10 000 | |
| ගැනිලි | 250 000 | 200 000 | 20 000 | වැටුප් | 60 000 | | |
| ගැනිලි පොලී | 5 000 | | | ප්‍රාග්ධන පොලී | 80 000 | 60 000 | |
| | | | | ලාභ කොටස් | 165 000 | 110 000 | |
| | | | | ණය පොලී | | 100 000 | |
| | | | | කුලී | | 90 000 | |
| 2010.03.31 දින ප.ගෙ.ගි. ශේෂය | 30 000 | 160 000 | | 2010.03.31 දින ප.ගෙ.ගි. ශේෂය | | | 20 000 |
| | 305 000 | 370 000 | 20 000 | | 305 000 | 370 000 | 20 000 |
| 2010.04.01 දින ඉ.ගෙ.ආ ශේෂය | | | 20 000 | 2010.04.01 දින ඉ.ගෙ.ආ ශේෂය | 30 000 | 160 000 | |

(ix) ජංගම ගිණුමේ දක්වා ඇති ගැනිලි සඳහා පොලිය වර්ෂයේ පළමු මාස හය සඳහා අදාළ වේ.

(x) ඒ ඒ කාලපරිච්ඡේදයට අදාළව, නිශ්චිතව හඳුනාගත හැකි ආදායම් සහ වියදම් හැර, අනෙකුත් ආදායම් හා වියදම් වර්ෂය පුරා ඒකාකාරීව උපචිත වී ඇතැයි උපකල්පනය කරන්න.

**අවශ්‍යවන්නේ :**

(1) අනුර සහ සෙනුර හවුල් ව්‍යාපාර ගිවිසුමේ අඩංගු වූ කොන්දේසි හතරක්

(2) කීර්තිනාමය ගැළපීමට සහ වත්කම්වල ධාරණ වටිනාකම වෙනස්වීම වාර්තා කිරීමට අවශ්‍ය ජ'නල් සටහන්

(3) 2009 සැප්තැම්බර් 30 දිනෙන් අවසන් මාස 6 සඳහා සහ 2010 මාර්තු 31 දිනෙන් අවසන් මාස 6 සඳහා හවුල් ව්‍යාපාරයේ ලාභය හෝ අලාභය වෙන වෙන ම

(4) 2009 සැප්තැම්බර් 30 දිනෙන් අවසන් මාස 6 සඳහා සහ 2010 මාර්තු 31 දිනෙන් අවසන් මාස 6 සඳහා ලාභය/අලාභය විසර්ජනය කළ යුතු ආකාරය වෙන වෙන ම දක්වන ප්‍රකාශනයක්

(5) අවශ්‍ය ගැළපීම් සිදු කිරීමෙන් පසු 2010 මාර්තු 31 දිනට අනුර, සෙනුර සහ වෙනුර හවුල් ව්‍යාපාරයේ ශේෂ පත්‍රය

*(ලකුණු 20 යි)*

**2.** සුමුදු සහ සමාගම 2010 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා රු. 750 000 ක ලාභයක් වාර්තා කොට ඇත. කෙසේ නමුත් පහත සඳහන් වැරදි පසුව සොයා ගන්නා ලදී.

(i) 2009.03.31 දිනට තොගය රු. 50 000 කින් අධි තක්සේරු වී තිබුණි.

(ii) ආපසු යැවුම් රු. 30 000 ක් ණයහිමි පාලන ගිණුමට බැර කර ඇති අතර රු. 3 000 ක් පමණක් ආපසු යැවුම් ගිණුමට බැර කර තිබුණි.

(iii) දුන් වට්ටම් රු. 6 000 ක් ලැබූ වට්ටම් ගිණුමට හර කර තිබුණි.

(iv) එකතුකළ අගය මත බදු (VAT) රු. 1 200 ක් ද ඇතුළුව මුදලට විකුණුම් රු. 11 200 විකුණුම් ගිණුමට බැර කර ඇත.

(v) වර්ෂය සඳහා පොලී වියදම රු. 5 000 ක් අඩුවෙන් ගිණුම්ගත කර ඇත.

(vi) 2010 මාර්තු 31 දිනට තොගවල ශුද්ධ උපලබ්ධි අගය පිරිවැයට වඩා රු. 25 000 ක් අඩු විය. කෙසේ නමුත් වර්ෂයේ ලාභය ගණනය කිරීමේ දී අවසන් තොගය පිරිවැයට තක්සේරු කර ඇත.

**අවශ්‍යවන්නේ :**

(1) වැරදි නිවැරදි කිරීම සඳහා ජ'නල් සටහන්

(2) වැරදි නිවැරදි කිරීමෙන් පසු වර්ෂය සඳහා ලාභය

(3) වැරදි නිවැරදි කිරීමෙන් පසු ශුද්ධ වත්කම්වල වැඩිවීම හෝ අඩුවීම *(ලකුණු 10 යි)*

[ එකොළොස්වැනි පිටුව බලන්න.

අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

**3.** පහත සඳහන් ගනුදෙනු සහ සිද්ධීන් 2010 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා සමාගමකට අදාළ වේ.

| දිනය | ගනුදෙනු සහ සිද්ධීන් |
|---|---|
| 2009.04.01 | මෙදිනට පිරිවැය රු. 360 000 ක් හා සමුච්චිත ක්ෂය රු. 160 000 ක් වූ ගොඩනැගිල්ලකට රු. 120 000 ක් වැය කරමින් ව්‍යුහාත්මක වෙනස්කම් සිදුකරන ලදී. මෙමගින් එහි ආරම්භක අපේක්ෂිත ජීව කාලය වූ වර්ෂ 30, වර්ෂ 36 දක්වා දීර්ඝ වී ඇත. කෙසේ නමුත් ගොඩනැගිල්ලේ සුන්බුන් අගය වූ රු. 60 000, ව්‍යුහාත්මක වෙනසින් පසුව ද නොවෙනස් ව පවතී. |
| 2009.07.01 | රු. 900 000 ක් පිරිවැය වූ සමාගමේ ඉඩම් කට්ටියක් අධි තාක්ෂණ යන්ත්‍රයකට හුවමාරු කරන ලදී. එදිනට මෙම යන්ත්‍රයෙහි සහ ඉඩමෙහි සාධාරණ අගය රු. 1 000 000 බැගින් විය. යන්ත්‍රසූත්‍ර පිරිවැය මත වර්ෂයකට 20% ක් ක්ෂය කරනු ලැබේ. |
| 2009.10.01 | 2009.03.31 දිනට පිරිවැය රු. 1 000 000 ක් වූ සහ සමුච්චිත ක්ෂය රු. 300 000 ක් වූ උපකරණයක් රු. 600 000 කට ප්‍රත්‍යාගණනය කරන ලදී. උපකරණ වාර්ෂිකව 25% බැගින් සරල මාර්ග ක්‍රමයට ක්ෂය කරනු ලැබේ. |
| 2010.01.01 | රු. 300 000 කට මිලදී ගෙන තිබූ යන්ත්‍රයක් රු. 25 000 කට විකුණන ලදී. 2009.03.31 දිනට මෙම යන්ත්‍රයේ සමුච්චිත ක්ෂය රු. 300 000 ක් විය. |

**අවශ්‍යවන්නේ :**

(1) ඉහත ගනුදෙනුවලට අදාළව 2010 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුළු ක්ෂය ප්‍රමාණය

(2) ඉහත ගනුදෙනු නිසා වර්ෂයේ ලාභය වැඩි වූ හෝ අඩු වූ ප්‍රමාණය

(3) 2009.10.01 සහ 2010.01.01 දින සිදු වූ ගනුදෙනු නිසා 2010 මාර්තු 31 දිනට යන්ත්‍ර සහ උපකරණවල ධාරණ වටිනාකම වැඩි වූ හෝ අඩු වූ ප්‍රමාණය

(4) ඉහත ගනුදෙනු නිසා වර්ෂය තුළ දී මුදල් ශේෂය වැඩි වූ හෝ අඩු වූ ප්‍රමාණය

*(ලකුණු 10 යි)*

**4.** 2010.03.31 දිනට සුබසාධක සංගමයක ශේෂ පිරික්සුම පහත දී ඇත.

The National e-learning Portal for The General Education

| ගිණුම | හර (රු. '000) | බැර (රු. '000) |
|---|---|---|
| මුදල් | 50 | |
| මුදල් අත්තිකාරම් | 100 | |
| වාර්ෂිකව 10% ස්ථාවර තැන්පතු | 60 | |
| ලැබූ පොලී | | 6 |
| 2009.04.01 දිනට ලිපිද්‍රව්‍ය | 2 | |
| මිලදී ගත් ලිපිද්‍රව්‍ය | 21 | |
| උපකරණ | 80 | |
| 2010.03.31 දිනට උපකරණ මත ක්ෂය වෙන්කිරීම් | | 48 |
| උපකරණ ක්ෂය | 8 | |
| පරිපාලන වියදම් | 50 | |
| කාර්යාලීය කුලී | 30 | |
| සුබසාධන වියදම් | 174 | |
| 2009.04.01 දිනට හිඟ සාමාජික මුදල් | 25 | |
| 2009.04.01 දිනට කලින් ලද සාමාජික මුදල් | | 15 |
| ලැබූ සාමාජික මුදල් | | 272 |
| 2009.04.01 දිනට සමුච්චිත අරමුදල | | 259 |
| | 600 | 600 |

**අතිරේක තොරතුරු :**

(i) 2010 මාර්තු 31 දිනට ලිපිද්‍රව්‍ය තොගය රු. 3 000 යි.

(ii) 2010 මාර්තු 31 දිනට හිඟ සහ කලින් ලද සාමාජික මුදල් පිළිවෙළින් රු. 40 000 ක් සහ රු. 10 000 ක් විය.

(iii) 2009.04.01 දිනට හිඟ සාමාජික මුදල්වලින් රු. 10 000 ක් අය කරගත නොහැකි බව හෙළිදරව් කරගන්නා ලදී.

(iv) භෞතික මුදල් ශේෂය රු. 5 000 කින් අඩු වූ අතර මෙය කපා හැරීමට තීරණය කරන ලදී.

(v) ශේෂ පිරික්සුමෙහි දක්වා ඇති 'මුදල් අත්තිකාරම්' මගින් පෙන්නුම් කරනුයේ 2010 ජනවාරි 01 දින පොත් අලෙවිසැලක් පවත්වාගෙන යාමට සංගමය මගින් පත් කළ සුබසාධක කමිටුවට ලබාදුන් මුදල් වේ. කමිටු සභාපති විසින් පහත සඳහන් තොරතුරු සපයා ඇත.

62609

* මුදල් පොතේ සාරාංශය :

| | (රු. '000) | (රු. '000) |
|---|---|---|
| මුදල් අත්තිකාරම් | | 100 |
| පොත්පත් හා සහරා විකුණුම් | | 300 |
| අඩුකළා : | | 400 |
| පොත්පත් සහ සහරා සැපයීම සඳහා ගෙවීම් | 280 | |
| ලී බඩු මිලදී ගැනුම් | 40 | |
| විකුණුම් කාර්ය මණ්ඩල වැටුප් | 15 | |
| ප්‍රවාහන වියදම් | 5 | 340 |
| 2010.03.31 දිනට මුදල් ශේෂය | | 60 |

* 2010 මාර්තු 31 දිනට පොත්පත් හා සහරා තොගය රු. 120 000 ක් විය.
* සාමාජිකයින් විසින් පරිත්‍යාග කරන ලද පොත්වල වටිනාකම රු. 75 000 ක් වූ අතර මෙයින් රු. 50 000 ක පොත් 2010 මාර්තු 31 දින වන විට විකුණා නොතිබිණි. මෙය 2010 මාර්තු 31 දින තොගයේ ඇතුළත් ව නැත.
* මාස තුන සඳහා ලී බඩුවල ක්ෂය රු. 5 000 කි.
* කාර්යාලීය කුලීවලින් 1/3 ක් පොත් අලෙවිසැලට අය කළ යුතු වේ.
* 2010 මාර්තු 31 දිනට පොත්පත් සහ සහරා සැපයුම්කරුවන්ට ගෙවිය යුතු මුදල රු. 40 000 කි.

**අවශ්‍යවන්නේ :**

(1) සාමාජික මුදල් ගිණුම

(2) 2010 මාර්තු 31 දිනෙන් අවසන් මාස තුන සඳහා පොත් අලෙවිසැලේ ලාභය හෝ අලාභය ගණනය කර පෙන්වන ප්‍රකාශයක්

(3) 2010 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සුබසාධක සංගමයේ ආදායම් ප්‍රකාශනය

(4) 2010 මාර්තු 31 දිනට සුබසාධක සංගමයේ ශේෂ පත්‍රය *(ලකුණු 10 යි)*

**5.** 2010 මාර්තු 31 දිනට අනගි ට්‍රේඩර්ස් හි ශේෂ පත්‍රය පහත දී ඇත.

| | (රු. '000) |
|---|---|
| යන්ත්‍ර | 580 |
| තොග - අමුද්‍රව්‍ය | 45 |
| නොනිමි | 25 |
| නිමි | 10 |
| ණයගැතියෝ | 75 |
| මුදල් | 15 |
| | 750 |
| හිමිකම | 700 |
| ණයහිමියෝ | 30 |
| ගෙවිය යුතු සෘජු වැටුප් | 20 |
| | 750 |

**2010 ජුනි 30 දිනෙන් අවසන් කාර්තුව සඳහා අමතර තොරතුරු :**

(i) දෛනික පොත්වල එකතුන් :

| | (රු. '000) |
|---|---|
| විකුණුම් පොත | 1 000 |
| අමුද්‍රව්‍ය ගැනුම් පොත | 600 |
| ආපසු යැවුම් පොත | 10 |

(ii) මුදල් ලැබීම් සහ ගෙවීම් සාරාංශය :

| **මුදල් ලැබීම්** | (රු. '000) | **මුදල් ගෙවීම් :** | (රු. '000) |
|---|---|---|---|
| මුදලට විකුණුම් | 120 | සෘජු වේතන | 150 |
| ණයගැතියන්ගෙන් ලද මුදල් | 950 | නිෂ්පාදන පොදුකාර්ය | 105 |
| | 1070 | විකුණුම් සහ පරිපාලන වියදම් | 140 |
| | | ණයහිමියන්ට ගෙවීම් | 610 |
| | | උත්සව අත්තිකාරම් | 25 |
| | | | 1030 |

[ දහතුන්වැනි පිටුව බලන්න.

අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

(iii) තබන ලද ජ'නල් සටහන් :

| ගිණුම | හර (රු.'000) | බැර (රු.'000) |
|---|---|---|
| ක්ෂය | 20 | |
| ක්ෂය සඳහා වෙන්කිරීම් (යන්ත්‍ර මත ක්ෂය වෙන්කිරීම) | | 20 |
| සෘජු වේතන | 30 | |
| ගෙවිය යුතු සෘජු වේතන (උපචිත වේතන ගිණුම්ගත කිරීම) | | 30 |

(iv) 2010 ජුනි 30 දිනට තොග : රු.'000

| | |
|---|---|
| අමුද්‍රව්‍ය | 20 |
| නොනිමි | 35 |
| නිමි | 30 |

(v) 2010 මාර්තු 31 දිනට යන්ත්‍රවල පිරිවැය රු. 800 000 කි.

**අවශ්‍යවන්නේ :**

(1) දෛනික පොත්පත්වල එකතුව ලෙජරයට පිටපත් කිරීම සඳහා ජ'නල් සටහන්

(2) 2010 ජුනි 30 දිනට ශේෂ පිරික්සුම

(3) 2010 ජුනි 30 දිනෙන් අවසන් කාර්තුව සඳහා නිෂ්පාදන ගිණුම

(4) 2010 ජුනි 30 දිනෙන් අවසන් කාර්තුව සඳහා ආදායම් ප්‍රකාශනය (ලකුණු 10 යි)

6. (අ) 2010 මාර්තු මාසය සඳහා සමාගමක ණයගැති ලෙජරයෙන් උපුටාගත් තොරතුරු පහත දී ඇත.

| ණයගැතියාගේ නම | 2010.03.01 දිනට ශේෂය රු. | විකුණුම් රු. | මුදල් ලැබීම් රු. | ආපසු එවූ විකුණුම් රු. | කපා හළ බොල්ණය රු. | 2010.03.31 දිනට ශේෂය රු. |
|---|---|---|---|---|---|---|
| අමල් | 10 000 | ? | 45 000 | 5 000 | - | 10 000 |
| ජානක | 25 000 | 45 000 | 50 000 | ? | - | 15 000 |
| ශාන්ත | 15 000 | 40 000 | 35 000 | - | - | ? |
| සුනිමල් | 20 000 | 50 000 | 60 000 | - | ? | 5 000 |

**අතිරේක තොරතුරු :**

(i) පසුගිය මාසයේ බොල්ණය ලෙස ණයගැතියෙකුගෙන් කපා හළ රු. 8 000 ක ශේෂය ඔහු විසින් මාර්තු මාසයේ දී ගෙවන ලදී.

(ii) මාසය අග ණයගැති ශේෂය මත 5% ක් අඩමාන ණය ලෙස වෙන්කිරීම සමාගමේ ප්‍රතිපත්තිය වේ.

**අවශ්‍යවන්නේ :**

(1) ඉහත ණයගැති ලේඛනයේ (?) ලකුණ යොදා ඇති තැන්හි තිබිය යුතු වටිනාකම්

(2) උපචිත පදනම සහ මුදල් පදනම අනුව මාර්තු මාසය සඳහා විකුණුම් ආදායම වෙන වෙන ම

(3) බොල් හා අඩමාන ණය වෙන්කිරීමේ ගිණුම

(4) මාසය අවසානයේ දී ණයගැතියන්ගේ ශුද්ධ වැඩිවීම හෝ අඩුවීම (ලකුණු 05 යි)

(ආ) 2010 මාර්තු 31 දිනට ව්‍යාපාරයක බැංකු ප්‍රකාශනයෙහි රු. 3 000 ක බැර ශේෂයක් පැවතිණි. එදිනට මුදල් පොතේ සහ බැංකු ප්‍රකාශනයේ ශේෂ සංසන්දනයේ දී පහත තොරතුරු අනාවරණය කරගන්නා ලදී.

(i) රු. 80 000 ක තැන්පත් කළ චෙක්පත් උපලබ්ධි වී නොතිබිණි.

(ii) සැපයුම්කරුවෙකුට නිකුත් කළ රු. 30 000 ක චෙක්පතක් බැංකුවට ඉදිරිපත් කර නොමැත.

(iii) බැංකු ප්‍රකාශනයට අනුව වූ රු. 500 ක බැංකු ගාස්තු සහ ස්ථාවර නියෝග මත ගෙවූ රු. 1 500 ක කුලී මුදල් පොතේ වාර්තා කර නොමැත.

(iv) බැංකුව විසින් රු. 20 000 ක චෙක්පතක් අගරු කර එවා ඇති අතර, ඒ සම්බන්ධයෙන් මුදල් පොතේ සටහන් තබා නොමැත. මෙම චෙක්පත ණයගැතියකුගෙන් ලැබී බැංකුවේ තැන්පත් කර තිබුණි.

**අවශ්‍යවන්නේ :**

(1) 2010 මාර්තු මාසය සඳහා බැංකු සැසඳුම් ප්‍රකාශනය

(2) අවශ්‍ය ගැළපීම් සිදුකිරීමට පෙර 2010 මාර්තු 31 දිනට මුදල් පොතේ ශේෂය

(3) චෙක්පත අගරුවීම වාර්තා කිරීම සඳහා අවශ්‍ය ජ'නල් සටහන (ලකුණු 05 යි)

(මුළු ලකුණු 10 යි)

***

62624

සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

33 S II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2010 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர(உயர் தர)ப் பரீட்சை, 2010 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2010

ගිණුම්කරණය II
கணக்கீடு II
Accounting II

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

විභාග අංකය ..............................

**අයදුම්කරුවන්ට උපදෙස් :**

※ I කොටසේ ප්‍රශ්න **සියල්ලට ම මෙම ප්‍රශ්න පත්‍රයේ ම** පිළිතුරු සපයන්න. සෑම ප්‍රශ්නයකට ම ලකුණු 01 බැගින් හිමි වේ.

※ I කොටසේ පිළිතුරු පත්‍රය II කොටසේ පිළිතුරු පත්‍රය සමඟ **එකට අමුණා** භාර දෙන්න.

**පරීක්ෂකගේ ප්‍රයෝජනය සඳහා පමණි.**

| I කොටස සඳහා | |
|---|---|
| ප්‍රශ්න අංක | ලැබූ ලකුණු |
| 1 - 20 | |
| 21 - 40 | |
| එකතුව | |

## I කොටස

● අංක 1 සිට 20 තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේ දී වඩාත් නිවැරදි පිළිතුර පෙරටු ව ඇති කොටුව තුළ "✓" ලකුණ යොදන්න. උදා : ✓

1. පහත තොරතුරු තනි නිෂ්පාදිතයකට අදාළ වන්නේ නම් මුළු දායකය කොපමණ ද?

| | |
|---|---|
| ස්ථාවර පොදුකාර්ය | රු. 400 000 |
| ආරක්ෂිත ආන්තිකය | රු. 200 000 |
| දායක විකුණුම් අනුපාතය | 40% |

(1) රු. 200 000
(2) රු. 240 000
(3) රු. 400 000
(4) රු. 480 000
(5) රු. 600 000

2. පහත සඳහන් කුමන ප්‍රකාශය පිරිවැය - පරිමා - ලාභ විශ්ලේෂණයට අදාළව සත්‍ය වන්නේ ද?

(1) ලාභයක් ඉපැයීමට ආරක්ෂිත ආන්තිකයක් තිබීම අත්‍යවශ්‍ය වේ.
(2) සමච්ඡේදන ලක්ෂ්‍යයේදී ස්ථාවර පිරිවැය මුළු දායකත්වයට වඩා අඩු වේ.
(3) දී ඇති මෙහෙයුම් පරිමාවක දී උපයන ලාභය ආරක්ෂිත ආන්තිකය මගින් පෙන්නුම් කෙරේ.
(4) මෙහෙයුම් පරිමාව වෙනස්වන විට ඒකකයක විචල්‍ය පිරිවැය වෙනස් වේ.
(5) දායක විකුණුම් අනුපාතය මගින් පෙන්නුම් කරනුයේ විකුණුම් මිලෙහි ප්‍රතිශතයක් ලෙස විචල්‍ය පිරිවැයයි.

3. ව්‍යාපාරයක ජංගම අනුපාතය ක්ෂණික අනුපාතය මෙන් දෙගුණයක් නම් පහත කුමන ප්‍රකාශය නිවැරදි වන්නේ ද?

(1) ජංගම වත්කම් ජංගම වගකීම්වලින් හරි අඩක් වේ.
(2) තොගය හැර ජංගම වත්කම්, තොගය මෙන් දෙගුණයක් වේ.
(3) තොගය ජංගම වත්කම් වලින් හරි අඩකට සමාන වේ.
(4) ජංගම වගකීම් ජංගම වත්කම් මෙන් දෙගුණයක් වේ.
(5) ජංගම වත්කම් ජංගම වගකීම් මෙන් දෙගුණයක් වේ.

[ දෙවැනි පිටුව බලන්න.

අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

4. පහත සඳහන් අනුපාත අතුරෙන් කුමන අනුපාත දෙක ව්‍යාපාර ආයතනයක තෝලනය මැනීම සඳහා වඩාත් යෝග්‍ය වන්නේ ද?

A - දිගුකාලීන ණය / හිමිකම
B - මුළු ණය / මුළු වත්කම්
C - කෙටිකාලීන ණය / මුළු වත්කම්
D - ජංගම වත්කම් / ජංගම වගකීම්

(1) A සහ B
(2) A සහ C
(3) A සහ D
(4) B සහ C
(5) C සහ D

5. පහත සඳහන් ඒවායින් කුමක් නිෂ්පාදිත පිරිවැයක් **නොවන්නේ** ද?

(1) කර්මාන්තශාලාව සඳහා බලය
(2) කර්මාන්තශාලා සේවකයන්ගේ වැටුප්
(3) නිෂ්පාදනයේ දී භාවිත කළ අමුද්‍රව්‍ය
(4) නව නිෂ්පාදිතයක ප්‍රචාරණය
(5) නිෂ්පාදනයේ දී භාවිත කළ චක්‍ර ද්‍රව්‍ය

6. පිරිවැය ඒකකය නිෂ්පාදිතයක් නම්, පහත කුමන අයිතමයන් සෘජු ද්‍රව්‍ය ලෙස වර්ගකළ හැකි ද?

A - යකඩ කුරු නිෂ්පාදනය කිරීමේදී භාවිත කළ ලෝහ
B - නිෂ්පාදන යන්ත්‍ර සඳහා භාවිතකළ ලිහිසි තෙල්
C - ගණක යන්ත්‍ර නිෂ්පාදනයේදී යොදගත් ප්ලාස්ටික්

(1) A පමණි.
(2) C පමණි.
(3) A සහ B පමණි.
(4) A සහ C පමණි.
(5) A, B සහ C සියල්ලම.

- ප්‍රශ්න අංක **7** සහ **8** ට පිළිතුරු සැපයීමේ දී පහත තොරතුරු භාවිත කරන්න.

2010.03.31 දිනට සමාගමක තෝරාගත් ශේෂ පත්‍ර අයිතම සහ එදිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ලාභය පහත දී ඇත.

| අයිතමය | රු. |
|---|---|
| මුළු වත්කම් | 8 200 |
| මුළු වගකීම් | 4 200 |
| ප්‍රකාශිත ප්‍රාග්ධනය | 3 500 |
| වර්ෂය සඳහා ලාභය | 1 000 |

7. 2010 මාර්තු 31 දිනට හිමිකම කොපමණ ද?

(1) රු. 1 000
(2) රු. 4 000
(3) රු. 4 200
(4) රු. 4 500
(5) රු. 8 200

8. 2010 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ශුද්ධ වත්කම් සඳහා ප්‍රතිලාභය කොපමණ ද?

(1) රු. 1 000
(2) රු. 4 000
(3) රු. 4 200
(4) රු. 4 500
(5) රු. 8 200

[ තුන්වැනි පිටුව බලන්න.

9. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 36 ට අනුව වෙන්කිරීමක් හඳුනාගැනීම සඳහා පහත සඳහන් කුමන කොන්දේසි / කොන්දේසිය සම්පූර්ණ කළ යුතු ද?

A - පසුගිය සිද්ධියක ප්‍රතිඵලයක් ලෙස වර්තමාන බැඳීමක් තිබිය යුතු වීම

B - ආර්ථික ප්‍රතිලාභ පිටතට ගලා යාමේ භව්‍යතාවයක් තිබීම

C - වටිනාකම විශ්වාසදායි ලෙස මැනිය හැකි වීම

(1) A පමණි.
(2) A සහ B පමණි.
(3) A සහ C පමණි.
(4) B සහ C පමණි.
(5) A, B සහ C සියල්ලම.

10. සිල්ලර ව්‍යාපාරයක ප්‍රතිපත්තිය වනුයේ විකුණුම් මත සැමවිටම 20% ක දළ ලාභයක් උපයා ගැනීමයි. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 05 ට අනුව පහත සඳහන් කුමන මිනුම් ක්‍රමය මෙම ව්‍යාපාරයේ තොග අගය කිරීම සඳහා වඩාත් යෝග්‍ය වන්නේ ද?

(1) පිරිවැය නිශ්චිතව හඳුනාගැනීමේ ක්‍රමය
(2) සිල්ලර ක්‍රමය
(3) පෙර ඇතුළු පෙර පිට ක්‍රමය (FIFO)
(4) භරිත සාමාන්‍ය පිරිවැය ක්‍රමය
(5) සම්මත පිරිවැය ක්‍රමය

11. වර්ෂයක් තුළදී වෙළඳ ණයගැතියන්ගේ වැඩිවීම රු. 40 000 ක් සහ එම වර්ෂය තුළ ණයට විකුණුම් රු. 200 000 ලෙස දී ඇති විට ගිණුම් වර්ෂය තුළ ණයගැතියන්ගෙන් ලද මුදල කොපමණ ද?

(1) රු. 40 000
(2) රු. 120 000
(3) රු. 160 000
(4) රු. 200 000
(5) රු. 240 000

12. පහත තොරතුරුවලට අදාළව ව්‍යාපාරයක ගිණුම් වර්ෂයක් තුළ දී මෙහෙයුම් කටයුතුවලින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහයේ වැඩිවීම හෝ අඩුවීම කොපමණ ද?

| | රු. |
|---|---|
| වර්ෂය සඳහා ලාභය | 120 000 |
| ක්ෂය | 20 000 |
| වෙළඳ ණයගැතියන්ගේ වැඩිවීම | 60 000 |
| උපචිත වේතනවල අඩුවීම | 40 000 |
| ඉදිරියට ගෙවූ වියදම්වල අඩුවීම | 50 000 |

(1) රු. 10 000 ක අඩුවීමක්
(2) රු. 90 000 ක වැඩිවීමක්
(3) රු. 140 000 ක වැඩිවීමක්
(4) රු. 150 000 ක වැඩිවීමක්
(5) රු. 190 000 ක වැඩිවීමක්

13. පිරිවැය එක්රැස් කිරීම, බෙදාහැරීම සහ පාලනය යන කාර්යයන් හඳුන්වන්නේ

(1) මූල්‍ය ගිණුම්කරණය ලෙස ය.
(2) පාලන ගිණුම් පවත්වා ගැනීම ලෙස ය.
(3) පිරිවැය ගිණුම්කරණය ලෙස ය.
(4) ව්‍යාපෘති ඇගයීම ලෙස ය.
(5) මුදල් ප්‍රවාහ විශ්ලේෂණය ලෙස ය.

[ හතරවැනි පිටුව බලන්න.

අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍රු/පිළිතුරු පත්‍රු/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

14. කළමනාකරණ ගිණුම්කරණය සම්බන්ධයෙන් පහත දී ඇති කුමන ප්‍රකාශය / ප්‍රකාශ නිවැරදි වේ ද?
   A - එය ආයතනයක කළමනාකරණ තොරතුරු පද්ධතියෙහි කොටසකි.
   B - එය සංවිධානයක මෙහෙයුම් කටයුතු සැලසුම් කිරීමට හා පාලනයට යොදා ගනී.
   C - එය බාහිර පාර්ශ්වයන්ට තීරණ ගැනීම සඳහා තොරතුරු සම්පාදනය කරයි.

(1) A පමණි.
(2) B පමණි.
(3) C පමණි.
(4) A සහ B පමණි.
(5) A, B සහ C සියල්ලම.

15. නිමි තොග පිරිවැය නිර්ණය කිරීමේ දී පහත අයිතමයන්ගෙන් ඇතුළත් කළ යුතු වන්නේ මොනවා ද?
   A - මිලදී ගත් බඩුවල ඉන්වොයිස් මිල
   B - ගබඩා භාරකරුගේ වැටුප
   C - මිලදී ගත් බඩු පරීක්ෂා කිරීම සඳහා දැරූ වියදම්
   D - විකිණීම සඳහා භාණ්ඩ සූදානම් කිරීමේ දී දැරූ ඇසුරුම් පිරිවැය

(1) A සහ B පමණි.
(2) A සහ C පමණි.
(3) A, C සහ D පමණි.
(4) A, B සහ D පමණි.
(5) A, B සහ C පමණි.

16. තොග පිරිවැය නිර්ණය කිරීම සඳහා විශේෂිත හඳුනාගැනීමේ ක්‍රමය අනුගමනය කරන මෝටර් රථ ව්‍යාපාරිකයෙකු මාසයක් සඳහා පහත තොරතුරු ඉදිරිපත් කරයි.

| විස්තරය | මාදිලිය | මෝටර් රථ ගණන | මෝටර් රථයක පිරිවැය (රු. '000) | මෝටර් රථයක විකුණුම් මිල (රු.'000) |
|---|---|---|---|---|
| ආරම්භක තොගය | 001 | 1 | 800 | |
| | 002 | 3 | 1 000 | |
| මිලදී ගැනුම් | 004 | 4 | 1 200 | |
| විකුණුම් | 001 | 1 | | 1 050 |
| | 002 | 1 | | 1 250 |
| | 004 | 3 | | 1 500 |

විකුණු මෝටර් රථවල පිරිවැය කොපමණ ද?

(1) රු. 3 200 000
(2) රු. 4 800 000
(3) රු. 5 400 000
(4) රු. 6 000 000
(5) රු. 6 800 000

17. සීමිත 'කැලණි' පොදු සමාගමේ කළමනාකරණය, 2010 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන 2010 මැයි 17 දින කෙටුම්පත් කරන ලදී. 2010 ජුනි මස 01 දින අධ්‍යක්ෂ මණ්ඩලය මෙම මූල්‍ය ප්‍රකාශන විමර්ශනය කර 2010 ජුනි 10 දින අත්සන් තබන ලදී. 2010 ජූලි 22 දින කොටස් හිමියන් සඳහා මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කළ අතර ඔවුන් ඒවා 2010 ජූලි 25 දින අනුමත කරන ලදී.
ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 12 ට අනුව සීමිත 'කැලණි' පොදු සමාගමේ ශේෂ පත්‍ර දිනට පසුව ඇතිවූ සිද්ධීන් හඳුනාගැනීමට අදාළ කාල පරිච්ඡේදය කුමක් ද?

(1) 2010 මාර්තු 31 සිට මැයි 17 දක්වා
(2) 2010 මාර්තු 31 සිට ජුනි 01 දක්වා
(3) 2010 මාර්තු 31 සිට ජුනි 10 දක්වා
(4) 2010 මාර්තු 31 සිට ජූලි 22 දක්වා
(5) 2010 මාර්තු 31 සිට ජූලි 25 දක්වා

18. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 10 ට අනුව ගිණුම්කරණ ප්‍රතිපත්ති තෝරාගැනීම සහ භාවිතය පිළිබඳ පහත කුමන ප්‍රකාශය /ප්‍රකාශ සත්‍ය වන්නේ ද?

A - ව්‍යාපාරයක් තෝරාගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති ඒකාකාරීව භාවිත කිරීම අවශ්‍ය වේ.
B - ගනුදෙනුවකට අදාළව ගිණුම්කරණ ප්‍රමිත නොමැති අවස්ථාවක ගිණුම්කරණ ප්‍රතිපත්ති තෝරා ගැනීමේ දී ආයතනයේ කළමනාකාරීත්වය විසින් ඔවුන්ගේ විනිශ්චය භාවිත කළ යුතුයි.
C - ව්‍යාපාරයක ගිණුම්කරණ ප්‍රතිපත්ති හෙළිදරව් කිරීම අත්‍යවශ්‍ය නොවේ.

(1) A පමණි.
(2) B පමණි.
(3) C පමණි.
(4) A සහ B පමණි.
(5) B සහ C පමණි.

19. ගිණුම්කරණ ඇස්මේන්තු සම්බන්ධයෙන් පහත සඳහන් කුමන ප්‍රකාශය නිවැරදි වන්නේ ද?

A - ඒවා විශේෂිත උපකල්පන මත පදනම් වේ.
B - ඒවා මූල්‍ය ප්‍රකාශනවල ගුණාත්මක ලක්ෂණ අවතක්සේරු කරයි.
C - නව තොරතුරු අනුව ඒවා වෙනස් වේ.
D - මූල්‍ය ප්‍රකාශන පිළියෙල කොට ඉදිරිපත් කිරීම සඳහා ඒවා අත්‍යවශ්‍ය වේ.

(1) A සහ B පමණි.
(2) B සහ C පමණි.
(3) C සහ D පමණි.
(4) A, B සහ C පමණි.
(5) A, C සහ D පමණි.

20. නිෂ්පාදන පොදුකාර්ය පිරිවැය සෘජු ශ්‍රම පැය මත අන්තර්ග්‍රහණය කරනු ලබන්නේ නම් පහත දී ඇති තොරතුරු අනුව සියලු නිෂ්පාදිතයන්ට අන්තර්ග්‍රහණය කරන ලද මුළු පොදුකාර්ය පිරිවැය කොපමණ ද?

| | මුළු පොදුකාර්යය | සෘජු ශ්‍රම |
|---|---|---|
| ඇස්තමේන්තුගත | රු. 600 000 | පැය 30 000 |
| සත්‍ය | රු. 540 000 | පැය 20 000 |

(1) රු. 320 000
(2) රු. 400 000
(3) රු. 525 000
(4) රු. 560 000
(5) රු. 600 000

21. 2009 මාර්තු 31 දිනට සමාගමක ප්‍රකාශිත ප්‍රාග්ධනය රු. 1 200 000 ක් වූ අතර කොටසක සාමාන්‍ය අගය රු. 10 ක් විය. 2010 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය තුළ දී සෑම කොටස් තුනකටම එකක් වන පරිදි කොටසකට රු. 10 ප්‍රතිෂ්ඨාවක් යටතේ සමාගමෙහි සංචිත ප්‍රාග්ධනිත කරන ලදී. පසුව සෑම කොටස් දෙකකටම එක බැගින් වන සේ කොටසක් රු. 9 බැගින් වූ හිමිකම් නිකුතුවක් කරන ලදී.

ප්‍රසාද කොටස් සහ හිමිකම් කොටස් නිකුතුවෙන් පසු සමාගමේ ප්‍රකාශිත ප්‍රාග්ධනය කුමක් ද?

..................................................................

22. පිළිගෙවුම් කාලයට (Payback) සාපේක්ෂව ශුද්ධ වර්තමාන අගයේ (NPV) වාසි **දෙකක්** සඳහන් කරන්න.

1. ..................................................................

2. ..................................................................

[ හයවැනි පිටුව බලන්න.

අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

23. ගිණුම් වර්ෂ දෙකක් සඳහා ව්‍යාපාරයකට අදළ තොරතුරු කිහිපයක් පහත දී ඇත.

| | 2010 (රු. '000) | 2009 (රු. '000) |
|---|---|---|
| මුළු වත්කම් | 250 | 200 |
| ණයට විකුණුම් | 150 | 75 |
| මුදලට විකුණුම් | 250 | 325 |
| සාමාන්‍ය ණයගැතියෝ | 30 | 15 |

2009 වර්ෂයට සාපේක්ෂව 2010 වර්ෂයේ දී ණය එකතු කිරීමේ කාලය සහ මුළු වත්කම් පිරිවැටුම අනුපාතය වැඩි වී තිබේ ද අඩු වී තිබේ ද නැතහොත් වෙනස් වී නැද්ද යන්න සඳහන් කරන්න.

(අ) ණය එකතු කිරීමේ කාලය : ..........................................................................................

(ආ) මුළු වත්කම් පිරිවැටුම් අනුපාතය : ..........................................................................

24. පහත දී ඇති ප්‍රස්තාර ව්‍යාපාරයක සමාන මූලික ආයෝජන වටිනාකම්වලින් යුත් ව්‍යාපෘති හතරකට අදළ වේ.







(අ) ආයෝජන මුදල ඉක්මනින් ආවරණය කර ගැනීම සමාගම අපේක්ෂා කරන්නේ නම් කුමන ව්‍යාපෘතිය තෝරා ගත යුතු ද?

..........................................................................................................................

(ආ) ව්‍යාපෘතියෙහි මුදල් ප්‍රවාහයන්ගේ කාලීන අගය සලකා බලන්නේනම්, කුමන ව්‍යාපෘතිය/ව්‍යාපෘති මූල්‍යමය වශයෙන් ඵලදායි වේ ද?

..........................................................................................................................

25. අනෙකුත් සාධක ස්ථාවරව තිබියදී නිෂ්පාදිත ඒකකයක විකුණුම් මිල වෙනස් වන විට සමච්ඡේදන ලක්ෂ්‍යය ඒකක 2 000 සිට 2 500 දක්වා වෙනස් විය. ස්ථාවර පිරිවැය රු 100 000 ක් විය. ඒකකයක විකුණුම් මිල කොපමණ ප්‍රමාණයකින් වැඩිවී ද නැතහොත් අඩුවී ද යන්න සඳහන් කරන්න.

..........................................................................................................

26. පහත සඳහන් කරුණුවලට අදළව කළමනාකරණ ගිණුම්කරණය සහ මූල්‍ය ගිණුම්කරණය අතර වෙනස සඳහන් කරන්න.

| කරුණ | කළමනාකරණ ගිණුම්කරණය | මූල්‍ය ගිණුම්කරණය |
|---|---|---|
| තොරතුරු භාවිත කරන්නන් | .......................................... | .................................... |
| වාර්තා කිරීමේ වාර ගණන | .......................................... | .................................... |

27. ආයතනයක් විසින් නිෂ්පාදනාගාරයේ භාවිත කළ යන්ත්‍රයක් රු. 750 000 කට විකුණූ අතර විකුණුම් දිනට එහි ධාරණ වටිනාකම රු. 800 000 ක් විය. විකිණීමෙන් ලද මුදල රු. 1 600 000 ක් වටිනා නව යන්ත්‍රයක් මිලදී ගැනීම සඳහා යොදවන ලදී. ඉතිරිය බැංකු ණයක් මගින් පියවන ලදී.

ඉහත ගනුදෙනුවලින් පැන නගින පහත ද ගණනය කර දක්වන්න.

(අ) ශුද්ධ මුදල් ප්‍රවාහය : ..................................................................

(ආ) මුදල් ප්‍රවාහ නොවන අයිතමය : ...................................................

28. නිෂ්පාදිතයක පිරිවැය ගණනය කිරීමේ අරමුණු **දෙකක්** සඳහන් කරන්න.

1. ..............................................................................................

2. ..............................................................................................

29. ආයතනයක් විසින් දරා ඇති පහත පිරිවැය එක් භාණ්ඩයක් නිෂ්පාදනය කිරීමට අදාළ වේ.

| | රු. |
|---|---|
| භාවිත කළ සෘජු ද්‍රව්‍ය | 150 000 |
| විකුණුම් වියදම් | 5 000 |
| වක්‍ර නිෂ්පාදන වැටුප් | 7 000 |
| පරිපාලන වියදම් | 10 000 |
| කම්හල් උපකරණ ක්ෂය | 70 000 |
| සෘජු ශ්‍රම පිරිවැය | 40 000 |
| කර්මාන්තශාලා සේවකයින් සඳහා ගෙවූ අතිකාල දීමනා | 20 000 |
| භාවිත කළ වක්‍ර අමුද්‍රව්‍ය | 45 000 |

නිෂ්පාදිතයේ මුළු පිරිවැය කුමක් ද?

..............................................................................................

30. (අ) ගබඩා ලෙජරය පවත්වාගෙන යාමේ අරමුණ සඳහන් කරන්න.

..............................................................................................

(ආ) ගබඩා ලෙජරය යාවත්කාලීන කිරීමේ දී භාවිත කරනු ලබන ප්‍රභව ලියවිලි **දෙකක්** නම් කරන්න.

1. ..............................................................................................

2. ..............................................................................................

31. ආර්ථික ඇණවුම් ප්‍රමාණය තීරණය කරන පිරිවැය වර්ග **දෙක** සඳහන් කරන්න.

1. ..............................................................................................

2. ..............................................................................................

32. බේකරි අයිතම කිහිපයක් නිපදවන ආයතනයක පහත පිරිවැය මූලිකාංග සඳහා **එක්** උදාහරණය බැගින් දෙන්න. (බේකරි අයිතම පිරිවැය ඒකක ලෙස සලකන්න.)

සෘජු අමුද්‍රව්‍ය ..............................................................................................

වක්‍ර ශ්‍රමය ..............................................................................................

වක්‍ර වියදම් ..............................................................................................

වක්‍ර අමුද්‍රව්‍ය ..............................................................................................

33. පහත වගුවේ දී ඇති එක් එක් පිරිවැය වර්ගීකරණයෙහි අරමුණ සඳහන් කරන්න.

| පිරිවැය වර්ගීකරණය | පිරිවැය වර්ගීකරණයේ අරමුණ |
|---|---|
| නිෂ්පාදන පිරිවැය සහ නිෂ්පාදන නොවන පිරිවැය වශයෙන් | .............................................. |
| විචල්‍ය පිරිවැය සහ ස්ථාවර පිරිවැය වශයෙන් | .............................................. |
| සෘජු ද්‍රව්‍ය පිරිවැය, සෘජු ශ්‍රම පිරිවැය සහ නිෂ්පාදන පොදුකාර්ය පිරිවැය වශයෙන් | .............................................. |
| අදාළ පිරිවැය සහ අදාළ නොවන පිරිවැය වශයෙන් | .............................................. |

[ අටවැනි පිටුව බලන්න.

අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

34. පහත සඳහන් එකිනෙක අයිතමය මෙහෙයුම් කටයුතු වලින් ජනනය වන මුදල් ප්‍රවාහ ද නැද්ද යන්න සඳහන් කරන්න.

| අයිතමය | ඔව් / නැත |
|---|---|
| ගෙවිය යුතු සේවක අර්ථසාධක අරමුදල් | .................. |
| ගෙවූ කාර්යාල කුලී | .................. |
| සේවකයින්ට ගෙවූ වේතන | .................. |
| ක්ෂය | .................. |

35. ආයතනයක් සම්බන්ධයෙන් පහත තොරතුරු සපයා ඇත.

| | 2010 (රු.) | 2009 (රු.) |
|---|---|---|
| වර්ෂය සඳහා ශුද්ධ ලාභය | 160 000 | 150 000 |
| පොලී වියදම | 40 000 | 30 000 |
| ක්ෂය | 20 000 | 20 000 |

(අ) 2010 වර්ෂය සඳහා පොලී ආවරණ අනුපාතය ගණනය කර දක්වන්න.

.......................................................................................................................................

(ආ) පසුගිය වර්ෂයට සාපේක්ෂව 2010 වර්ෂයේ පොලී ආවරණය අඩු වී ද නැතහොත් වැඩි වී ද යන්න සඳහන් කරන්න.

.......................................................................................................................................

● ප්‍රශ්න අංක **36** සිට **40** තෙක් ප්‍රශ්නවල දී ඇති ප්‍රකාශ **සත්‍ය** හෝ **අසත්‍ය** බව සඳහන් කරන්න.

36. අසම්භාව්‍ය වගකීම් මූල්‍ය ප්‍රකාශනවල හඳුනාගත යුතු ය. (...............)

37. සමච්ඡේදන ලක්ෂ්‍යයේ දී මුළු විකුණුම් ආදායම, එම අවස්ථාවේ දී දායකයෙහි සහ විචල්‍ය පිරිවැයෙහි එකතුවට සමාන වේ. (...............)

38. මූල්‍ය ප්‍රකාශනවල සියලු ම ගිණුම්කරණ නිමැවුම් අන්තර්ගත වේ. (...............)

39. ශේෂ පත්‍ර දිනට පසුව යෝජනා කරන ලද ලාභාංශ ශේෂ පත්‍ර දිනට වගකීමක් ලෙස හඳුනා ගත යුතු ය. (...............)

40. සියලු ම ඍජු පිරිවැය විචල්‍ය පිරිවැය වේ. (...............)

* *

The National e-learning Portal for The General Education

සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

62623

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

33 | S | II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2010 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர(உயர் தர)ப் பரீட்சை, 2010 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2010

ගිණුම්කරණය II (II කොටස)
கணக்கீடு II (பகுதி II)
Accounting II (Part II)

**අයදුම්කරුවන්ට උපදෙස් :**

- ✻ **පළමුවන** ප්‍රශ්නයට සහ තවත් ප්‍රශ්න **හතරකට** පමණක් පිළිතුරු සපයන්න.
- ✻ සෑම ප්‍රශ්නයකට ම පිළිතුරු ලිවීම **අලුත් කඩදාසියකින්** ආරම්භ කරන්න.
- ✻ අදාළ පෙරවැඩ, පිළිතුරු පත්‍රය සමඟ අමුණන්න.

1. 2010 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සීමිත සඳුන් පොදු සමාගමේ ආදායම් ප්‍රකාශනය, එදිනට ශේෂ පත්‍රය සහ අදාළ සටහන් පහත දක්වේ.

**2010 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශනය**

| | සටහන | |
|---|---|---|
| ශුද්ධ විකුණුම් | | 30 000 |
| විකුණුම් පිරිවැය | | 16 000 |
| දළ ලාභය | | 14 000 |
| වෙනත් ආදායම් | 1 | 450 |
| අඩුකළා : වියදම් | 2 | 7 130 |
| බදු පෙර ලාභය | | 7 320 |
| අඩුකළා : ආදායම් බදු | | 2 928 |
| අඩු කළා : ගෙවූ ලාභාංශ | | 690 |
| **වර්ෂයේ ලාභය** | | 3 702 |

**2010 මාර්තු 31 දිනට ශේෂ පත්‍රය**

| | | |
|---|---|---|
| දේපළ පිරියත සහ උපකරණ | | 40 000 |
| ස්ථාවර තැන්පතු | | 1 000 |
| තොග | | 500 |
| වෙළඳ ණයගැතියෝ | | 1 980 |
| මුදල් සහ මුදල් සමාන ද | 3 | 40 |
| **මුළු වත්කම්** | | 43 520 |
| ප්‍රකාශිත ප්‍රාග්ධනය | | 31 120 |
| රඳවාගත් ඉපැයුම් | | 4 000 |
| බැංකු ණය - වසර 2 සිට 5 ඇතුළත ගෙවිය යුතු ප්‍රමාණය | | 5 600 |
| බැංකු ණය - ලබන වසර ඇතුළත දී ගෙවිය යුතු ප්‍රමාණය | | 1 100 |
| වෙළඳ ණයහිමියෝ | | 1 500 |
| අනෙකුත් ගෙවිය යුතු ද | | 200 |
| **මුළු හිමිකම් සහ වගකීම්** | | 43 520 |

**සටහන 1 - වෙනත් ආදායම් :**

| | |
|---|---|
| ආයෝජන මත ආදායම් | 175 |
| උපකරණ විකුණුම්වලින් ලද ලාභය | 25 |
| ඉඩම් ප්‍රත්‍යාගණන අතිරික්තය | 250 |
| එකතුව | 450 |

[ දෙවැනි පිටුව බලන්න.

අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

**සටහන 2 - වියදම් :**

| | |
|---|---|
| වේතන | 2 200 |
| විගණන ගාස්තු | 300 |
| කළමනාකරණ උපදේශක ගාස්තු | 1 200 |
| ක්ෂය | 600 |
| සේවක අර්ථසාධක අරමුදල් සහ සේවක භාරකාර අරමුදල් | 396 |
| අධ්‍යක්ෂ ගාස්තු | 1 000 |
| බැංකු ණය පොලී | 34 |
| බැංකු අයිරා පොලී | 1 400 |
| එකතුව | 7 130 |

**සටහන 3 - මුදල් සහ මුදල් සමාන දෑ :**

| | |
|---|---|
| අතැති මුදල් | 15 |
| බැංකු අයිරාව | (25) |
| ත්‍රෛමාසික - භාණ්ඩාගාර බිල්පත් | 50 |
| එකතුව | 40 |

ඉහත මූල්‍ය ප්‍රකාශනවල ආකෘතිය සහ අන්තර්ගතය සම්බන්ධයෙන් සමාගමේ කළමනාකාරිත්වය සෑහීමට පත් නොවූ අතර 2010 මැයි 02 වැනි දින ඒවා විමර්ශනය කිරීමට කමිටුවක් පත්කරන ලදී. එම කමිටුව විසින් පහත සඳහන් සොයාගැනීම් සහ අදහස් ඇතුළත් කර වාර්තාවක් සපයන ලදී.

(i) මූල්‍ය ප්‍රකාශනවල ආකෘතිය සහ අන්තර්ගතය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 3 ‘මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම’ අනුව පිළියෙල කර නොමැත.

(ii) මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර ඇති සියලු සංඛ්‍යා රුපියල් දහස්වලින් (රු.’000) වුව ද ඒ බව සඳහන් කර නොමැත.

(iii) ශුද්ධ විකුණුම් ගණනය කර තිබුණේ පහත දක්වෙන බෙදාහැරීමේ වියදම් අඩු කිරීමෙන් පසුව ය.

| | (රු. ’000) |
|---|---|
| අඩමාන ණය සඳහා වෙන්කිරීම් | 80 |
| වේතන | 2 650 |
| ක්ෂය | 1 500 |
| සේවක අර්ථසාධක අරමුදල් සහ සේවක භාරකාර අරමුදල් | 270 |
| | 4 500 |

(iv) වෘත්තීය තක්සේරුකරුවෙකු විසින් සමාගමේ ඉඩම් වෙළඳපොළ සාධක පදනම් කරගෙන 2010 ජූනි 01 දින ප්‍රථමවරට ප්‍රත්‍යාගණනය කර ඇත.

(v) රු. 500 000 ක බැංකු අයිරා පහසුකම ලබාගෙන ඇත්තේ තොග ඇප ලෙස තැබීමෙනි.

(vi) මාස හයක වගකීම් සහතිකයකට යටත් ව සමාගම විසින් භාණ්ඩ විකිණීම මෙම වසර තුළ දී ආරම්භ කරන ලදී. මේ සම්බන්ධයෙන් ඇතිවිය හැකි වගකීම සඳහා සමාගම රු. 300 000 ක් වෙන්කළ යුතු යැයි යෝජනා කරයි.

(vii) ශේෂ පත්‍රයේ ඇතුළත් රු. 200 000 ක ණයගැතියෙකු 2010 මැයි 01 දින බුන්වත් වී ඇති බව ප්‍රකාශ වී ඇති අතර එම ශේෂයෙන් 25% ක් පමණක් එදින අය කරගෙන ඇත. සමාගමේ ප්‍රතිපත්තිය වනුයේ වසර අවසානයේ ණයගැති ශේෂයෙන් 10% ක් බොල්ණය සඳහා වෙන්කිරීම ය.

(viii) 2009 මාර්තු 15 දතම රු. 150 000 ක ගැනුම් ඉන්වොයිසියක් ගැනුම් ජ'නලයේ වාර්තා කර නොතිබුණි. කෙසේ නමුත් 2009 මැයි මාසයේ දී අදාළ මුදල සැපයුම්කරුට ගෙවා ඇති අතර එය ණයහිමි පාලන ගිණුමට හර කර ඇත.

(ix) පසුගිය වසරේ ආදායම් බදු සඳහා අතිරේක ව එකඟ වී ගෙවන ලද රු. 72 000 ක් විගණන ගාස්තුවල අඩංගු වේ. මෙම අතිරේක මුදල සඳහා වෙනත් කිසිදු ගැළපීමක් සිදු කර නොමැත.

**අවශ්‍යවන්නේ :**

(1) මූල්‍ය ප්‍රකාශනවල ආකෘතිය සහ අන්තර්ගතය සම්බන්ධව ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 3 ට අනුව ඉහත දී ඇති ආදායම් ප්‍රකාශනයේ සහ ශේෂ පත්‍රයේ මුහුණතෙහි හඳුනාගත හැකි අඩුපාඩු **හයක්**
**උදා : වාර්තා කරනු ලබන ඒකකයේ නම සඳහන් කර නොමැත.**

(2) අයිතම (viii) සහ (ix) හි දක්වා ඇති වැරදි නිවැරදි කිරීමට අවශ්‍ය ජ'නල් සටහන්

(3) 2010 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ප්‍රසිද්ධ කිරීමට සුදුසු ආකෘතියක් යටතේ සටහන් නොමැතිව සීමිත සඳුන් පොදු සමාගමේ ආදායම් ප්‍රකාශනය

(4) ඉහත (3) යටතේ පිළියෙල කරන ලද ආදායම් ප්‍රකාශනයට සම්බන්ධව සටහන්වල (වෙනත් ආදායම් හැර) කළ යුතු හෙළිදරව් කිරීම් **හයක්** වටිනාකම් සහිතව

(5) ප්‍රසිද්ධ කිරීමට සුදුසු ආකෘතියක් යටතේ 2010 මාර්තු 31 දිනට සටහන් ද ඇතුළත්ව සීමිත සඳුන් පොදු සමාගමේ ශේෂ පත්‍රය

*(ලකුණු 20 යි)*

2. (අ) 2009 අප්‍රේල් 01 දිනට සීමිත 'VEGI' පොදු සමාගමේ හිමිකම පහත දු වලින් සමන්විත විය.

| | (රු. '000) |
|---|---|
| සාමාන්‍ය කොටස් 500 000 | 7 000 |
| ප්‍රත්‍යාගණන සංචිත | 2 000 |
| රඳවා ගත් ඉපැයුම් | 3 500 |

අතිරේක තොරතුරු :

(i) 2010 ජනවාරි මාසය තුළ දී අයදුමේ දී එක්වර ගෙවිය යුතු එකක් රු. 20 බැගින් වූ සාමාන්‍ය කොටස් 100 000 ක් නිකුත් කරන ලදී. කොටස් 250 000 ක් සඳහා අයදුම්පත් ලැබුණි. කොටස් සමානුපාතිකව විභජනය කරන ලද අතර වැඩිපුර ලද මුදල් ආපසු යවන ලදී.

(ii) ප්‍රත්‍යාගණන සංචිත වසර 3 කට පෙර ඉඩම් ප්‍රත්‍යාගණනය කිරීමෙන් ලද අතිරික්තය පෙන්නුම් කරයි. මෙම වසර තුළ දී ද මෙම ඉඩම නැවත ප්‍රත්‍යාගණනය කරන ලද අතර එමගින් රු. 500 000 ක අලාභයක් පැන නැගුණි.

(iii) 2010 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ලාභය රු. 3 000 000 කි.

(iv) වර්ෂය තුළ දී ගෙවන ලද ලාභාංශ රු. 1 000 000 ක් විය.

(v) රඳවාගත් ඉපැයුම් භාවිත කරමින්, 2010 මාර්තු මාසය තුළ දී කොටසකට රු. 15 බැගින් වූ ප්‍රතිෂ්ඨාවකට සෑම සාමාන්‍ය කොටස් දෙකකට ම එක බැගින් වන සේ සංචිත ප්‍රාග්ධනිත කරන ලදී.

අවශ්‍යවන්නේ :

(1) කොටස් නිකුත් කිරීමේ ගිණුම

(2) ප්‍රසිද්ධ කිරීම සඳහා 2010 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය

(3) 2010 මාර්තු 31 දිනට කොටස් ප්‍රාග්ධන ගිණුමට අනුව කොටසක සාමාන්‍ය අගය

(4) ඉහත සංචිත ප්‍රාග්ධනිත කිරීම නිසා සීමිත 'VEGI' පොදු සමාගමේ 2010 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්වය වෙනස් වන්නේ ද යන්න හේතු සහිතව දක්වන්න.

(ලකුණු 05 යි)

(ආ) පහත දී ඇති තොරතුරු 2010.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සීමිත සුමේධා පොදු සමාගමට අදාළ වේ.

| | (රු. '000) |
|---|---|
| • වර්ෂය සඳහා ලාභය | 850 |
| • ක්ෂය | 100 |
| • වර්ෂය අවසානයේ මුදල් හැර ජංගම වත්කම්වල ශුද්ධ අඩුවීම | 120 |
| • වර්ෂය අවසානයේ ගෙවිය යුතු ආදායම් බදු හැර ජංගම වගකීම්වල ශුද්ධ අඩුවීම | 15 |
| • ආදායම් බදු වියදම | 400 |
| • ගෙවූ ආදායම් බදු | 350 |
| • විකුණන අවස්ථාවේ දී ධාරණ වටිනාකම රු. 700 000 ක් වූ යන්ත්‍රයක් විකිණීමෙන් ලද මුදල | 1 000 |
| • සාමාන්‍ය කොටස් නිකුත් කිරීමෙන් ලද මුදල | 3 000 |
| • ඉඩමක් අත්පත්කර ගැනීම සඳහා ගෙවන ලද මුදල | 2 000 |
| • රු. 8 000 ක පොලී ඇතුළු ව ගෙවූ ණය වාරික (වර්ෂය මුල හෝ අග උපචිත පොලී නොමැත.) | 98 |
| • වෙනත් සමාගම්වල කොටස් මිලදී ගැනීම සඳහා ගෙවූ මුදල් | 1 000 |
| • ගෙවූ ලාභාංශ | 600 |
| • ලද ලාභාංශ | 80 |
| • 2009 අප්‍රේල් 01 දිනට මුදල් ශේෂය | 6 000 |

අවශ්‍යවන්නේ :

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 9 ට අනුව 2010 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

(ලකුණු 05 යි)

(මුළු ලකුණු 10 යි)

අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

62623

**3.** සහරා ප්‍රකාශන සමාගමක් සතුව නිෂ්පාදන දෙපාර්තමේන්තු දෙකක් (P1 හා P2) සහ එක් සේවා දෙපාර්තමේන්තුවක් (S) ඇත. ප්‍රකාශන කාර්යයන්ට අදාළ ව පහත තොරතුරු ලබා දී ඇත.

(i) විභාජනය නොකළ නිෂ්පාදන පොදුකාර්ය පිරිවැය :

| | (රු.) |
|---|---|
| විදුලිය | 100 000 |
| යන්ත්‍ර ක්ෂය | 80 000 |
| දුරකථන ගාස්තු | 30 000 |

(ii) එක් එක් දෙපාර්තමේන්තුවේ නිෂ්පාදන පොදුකාර්ය හා අදාළ අනෙකුත් දත්ත :

| | P1 | P2 | S |
|---|---|---|---|
| ප්‍රතිපාදනය කළ පොදුකාර්ය (රු.) | 37 000 | 49 000 | 29 000 |
| අපේක්ෂිත විදුලි පරිභෝජනය (කිලෝ වොට්) | 500 | 400 | 100 |
| භාවිතයේ ඇති යන්ත්‍ර වටිනාකම (රු.) | 750 000 | 50 000 | – |
| දුරකථන ඇමතුම් කාලය(%) | 10 | 20 | 70 |
| ඇස්තමේන්තුගත යන්ත්‍ර පැය ගණන | 3 500 | 500 | – |
| ඇස්තමේන්තුගත සෘජු ශ්‍රම පැය ගණන | 1 000 | 5 000 | 1 800 |

(iii) සේවා දෙපාර්තමේන්තුවේ (S) නිෂ්පාදන පොදුකාර්ය පිරිවැය P1 හා P2 දෙපාර්තමේන්තු අතර නැවත විභාජනය කළ යුත්තේ පිළිවෙළින් 1:5 අනුපාතයට ය.

(iv) සමාගමේ ප්‍රතිපත්තිය වනුයේ P1 සහ P2 දෙපාර්තමේන්තුවල නිෂ්පාදන පොදුකාර්ය පිරිවැය පිළිවෙළින් යන්ත්‍ර පැය සහ සෘජු ශ්‍රම පැය මත අන්තර්ග්‍රහණය කිරීමයි.

(v) සමාගම විසින් ප්‍රකාශයට පත්කරන එක් සහරාවක් වූ 'නුවණ' සහරාවට අදාළ පහත තොරතුරු ලබා දී ඇත.

| | |
|---|---|
| ප්‍රකාශ කර බෙදහරින ලද සහරා සංඛ්‍යාව | 15 000 |
| P1 දෙපාර්තමේන්තුවේ භාවිත කළ යන්ත්‍ර පැය ගණන | 1 000 |
| P2 දෙපාර්තමේන්තුවේ භාවිත කළ සෘජු ශ්‍රම පැය ගණන | 1 500 |
| වැය වූ ප්‍රාථමික පිරිවැය (රු.) | 205 000 |
| බෙදහරින්නන් විසින් ආපසු එවන ලද සහරා සංඛ්‍යාව | 1 000 |
| සහරාවක සිල්ලර වෙළඳ මිල (රු.) | 50 |

(vi) විකුණන ලද සෑම සහරාවකට ම රු. 10 ක කොමිස් මුදලක් බෙදහරින්නන්ට ගෙවනු ලැබේ.

(vii) ආපසු එවන ලද සහරා සමාගම විසින් එකක් රු. 20 බැගින් පසුව විකුණන ලදී.

**අවශ්‍යවන්නේ :**

(1) භාවිත කළ එකිනෙක විභාජන පදනම සඳහන් කරමින් පොදු කාර්යය පිරිවැය විශ්ලේෂණ පත්‍රිකාවක්

(2) සේවා දෙපාර්තමේන්තුවේ මුළු පොදුකාර්ය P1 සහ P2 දෙපාර්තමේන්තු අතර නැවත විභාජනය කිරීම

(3) P1 සහ P2 දෙපාර්තමේන්තුවල පොදුකාර්ය පිරිවැය අන්තර්ග්‍රහණ අනුපාත

(4) P1 සහ P2 දෙපාර්තමේන්තු සඳහා පොදුකාර්ය පිරිවැය අන්තර්ග්‍රහණ අනුපාත ගණනය කිරීමට භාවිත කරන ලද පදනම සාධාරණීකරණය කිරීමට හේතුව බැගින්

(5) 'නුවණ' සහරාවක නිෂ්පාදන පිරිවැය

(6) ප්‍රකාශ කරන ලද සහරා 15 000 ට අදාළ ව ලාභය හෝ අලාභය දක්වන ප්‍රකාශනයක් *(ලකුණු 10 යි)*

**4.** පාසලක වාණිජ සංගමය විසින් සංවිධානය කරන ලද අධ්‍යාපන චාරිකාවකට අදාළව පහත සඳහන් තොරතුරු එක් රැස් කර ඇත.

| | (රු.) |
|---|---|
| • මගීන් 60 කට අසුන් ගතහැකි බසයක ප්‍රවාහන කුලිය | 15 000 |
| • සෑම සිසුවෙකු ම පැළඳිය යුතු හඳුනාගැනීමේ පළඳනයක පිරිවැය | 15 |
| • චාරිකා ප්‍රදර්ශන බැනර් මුද්‍රණ පිරිවැය | 3 500 |
| • සම්පූර්ණ චාරිකාව සංවිධානය කිරීමේ වියදම | 2 500 |
| • එක් ශිෂ්‍යයකුගේ ආහාර වියදම | 230 |
| • එක් ශිෂ්‍යයකු සඳහා වතුර බෝතල් වියදම | 80 |
| • සංවිධානය කොට ඇති ස්ථාන නැරඹීම සඳහා එක් ශිෂ්‍යයකුගේ ප්‍රවේශ පත්‍ර ගාස්තුව | 75 |
| • කුලියට ගන්නා ලද ඡායාරූප ශිල්පියාගේ ගාස්තුව | 3 000 |
| • එක් ශිෂ්‍යයකුගෙන් අය කළ යුතු ගාස්තුව | 1 000 |

• චාරිකාවෙන් කිසියම් අතිරික්තයක් ඇතිවේ නම් එය වාණිජ සංගමයේ පොදු අරමුදලට බැර කිරීමට තීරණය කර ඇත.

PAST PAPERS WIKI
The National e-Learning Portal for The General Education

[ දහතුන්වැනි පිටුව බලන්න.

**අවශ්‍යවන්නේ :**

(1) චාරිකාවෙහි අපේක්ෂිත මුළු ස්ථාවර පිරිවැය
(2) සම්විච්ඡේදනය වීම සඳහා චාරිකාවට සහභාගි විය යුතු සිසුන් සංඛ්‍යාව
(3) රු. 6 000 ක අතිරික්තයක් ලැබීම සඳහා චාරිකාවට සහභාගි විය යුතු සිසුන් සංඛ්‍යාව
(4) චාරිකාවෙහි ස්ථාවර පිරිවැය අඩු කළ නොහැකි යැයි උපකල්පනය කරමින් පොදු අරමුදලට මාරු කළ යුතු මුදල වැඩිකර ගැනීම සඳහා යෝජනා **දෙකක්**
(5) සහභාගිවන සිසුන් සංඛ්‍යාව 60 ක් වන්නේ නම් චාරිකාවෙන් ලැබෙන අතිරික්තය හෝ හිගය පෙන්වන ප්‍රකාශනයක්
(6) සහභාගිවන සිසුන් සංඛ්‍යාව 30 ක් වන්නේ නම් සමච්ඡේදනය වීම සඳහා එක් ශිෂ්‍යයකුගෙන් අය කළ යුතු ගාස්තුව

*(ලකුණු 10 යි)*

5. (අ) පහත සඳහන් තොරතුරු නිෂ්පාදන සමාගමක් විසින් භාවිත කරන අමුද්‍රව්‍යයකට අදාළ වේ.

(i) යළි ඇණවුම් ප්‍රමාණය ලෙස ආර්ථික ඇණවුම් ප්‍රමාණය (EOQ) වූ කි.ග්‍රෑ. 12 000 භාවිත කරයි.
(ii) ඇණවුමක් සිදු කිරීමේ පිරිවැය රු. 300 කි.
(iii) වාර්ෂික අමුද්‍රව්‍ය භාවිතය කි.ග්‍රෑ. 120 000 කි.
(iv) 2010 ජුනි මාසය තුළ අමුද්‍රව්‍ය ලැබීම් හා නිකුත්කිරීම් සාරාංශය :

| දිනය | විස්තරය | ප්‍රමාණය (කි.ග්‍රෑ) | විශේෂ කරුණු |
|---|---|---|---|
| ජුනි 01 | ශේෂය | 5 000 | කි.ග්‍රෑ. 1 ක් රු. 15 බැගින් මැයි 10 දින මිලටගත් කි.ග්‍රෑ. 1000<br>කි.ග්‍රෑ. 1 ක් රු. 20 බැගින් මැයි 25 දින මිලටගත් කි.ග්‍රෑ. 4000 |
| ජුනි 08 | නිකුත්කිරීම් | 2 000 | |
| ජුනි 10 | ලැබීම් | 12 000 | කි.ග්‍රෑ. 1 ක් රු. 25 බැගින් |
| ජුනි 30 | නිකුත්කිරීම් | 10 000 | |

(v) 2010 ජුනි 30 දින භෞතික අමුද්‍රව්‍ය ශේෂය කි.ග්‍රෑ. 5 200 ක් විය.
(vi) අමුද්‍රව්‍ය නිකුත්කිරීම් මිල කිරීම සඳහා, සමාගම පෙර ඇතුළු පෙර පිට (FIFO) ක්‍රමය භාවිත කරයි.

**අවශ්‍යවන්නේ :**

(1) 2010 ජුනි මාසය තුළ දී නිකුත් කරන ලද අමුද්‍රව්‍යවල මුළු පිරිවැය
(2) ගබඩා ලෙජරයට අනුව 2010 ජුනි 30 දිනට ඇති අමුද්‍රව්‍යවල පිරිවැය
(3) 2010 ජුනි 30 දින භෞතික අමුද්‍රව්‍ය ශේෂය සහ ලෙජර ශේෂය අතර වෙනසට බලපෑ හැකි හේතු **දෙකක්**
(4) EOQ ආකෘතියට අනුව මෙම අමුද්‍රව්‍යයේ තොග රඳවාගැනීමේ වාර්ෂික පිරිවැය

*(ලකුණු 05 යි)*

(ආ) පහත තොරතුරු 'වායා' පොදු සමාගමට අදළ වේ.

(i) 2010 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා තෝරාගන්නා ලද, වත්කම්, ආදායම් හා වියදම් :

| | (රු.) |
|---|---|
| සාමාන්‍ය ණයගැතියෝ | 60 000 |
| සාමාන්‍ය තොග | 80 000 |
| විකුණුම් පිරිවැය | 400 000 |
| මුළු වත්කම් | 270 000 |
| මුළු විකුණුම් | 540 000 |

(ii) 2009 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා තෝරාගත් අනුපාත :

- ණය එකතුකිරීමේ කාලය - දින 50
- මුළු වත්කම් පිරිවැටුම් අනුපාතය - වාර 1.2
- තොග පිරිවැටුම් අනුපාතය - වාර 4
- මුළු වත්කම් මත ප්‍රතිලාභය - 18%

(iii) සියලු විකුණුම් ණයට සිදුකරයි.
(iv) 2010 වර්ෂය සඳහා විකුණුම් මත ශුද්ධ ලාභ අනුපාතිකය 10% කි.
(v) වර්ෂයකට දින 360 ක් ඇතැයි උපකල්පනය කරන්න.

**අවශ්‍යවන්නේ :**

(1) 2010 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ණය එකතුකිරීමේ කාලය, තොග පිරිවැටුම් අනුපාතය, වත්කම් පිරිවැටුම් අනුපාතය හා මුළු වත්කම් මත ප්‍රතිලාභ අනුපාතය
(2) පසුගිය වර්ෂයේ අනුපාත හා සංසන්දනය කිරීමේ දී පහත ද වල වැඩි දියුණුවීමක් වී තිබේ ද යන්න සඳහන් කරන්න.
i. ද්‍රවශීලතා තත්ත්වය
ii. මුළු වත්කම් පාවිච්චි කිරීමේ කාර්යක්ෂමතාව
iii. මුළු වත්කම් මත ප්‍රතිලාභය

*(ලකුණු 05 යි)*
*(මුළු ලකුණු 10 යි)*

[ දහහතරවැනි පිටුව බලන්න.

අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

6. (අ) අමරසිංහ සමාගම, නව යන්ත්‍රයක් අත්පත්කර ගැනීම සඳහා වූ යෝජනාවක් ඇගයීම් කරමින් සිටින අතර පහත තොරතුරු ලබා දී ඇත.

| | (රු.) |
|---|---|
| යන්ත්‍රයේ ගැනුම් මිල | 140 000 |
| යන්ත්‍රය සවිකිරීමේ දී දැරිය යුතු පිරිවැය | 10 000 |
| 3 වන වර්ෂය අවසානයේ දී යන්ත්‍රයේ සුන්බුන් අගය | 20 000 |
| විකුණුම් ආදායමේ වාර්ෂික වැඩිවීම | 130 000 |
| මෙහෙයුම් වියදමේ වාර්ෂික වැඩිවීම | 30 000 |

- මෙම යන්ත්‍රය අවුරුදු 3 ක් භාවිත කිරීමට අපේක්ෂා කරයි.
- වර්ෂයකට 10% යටතේ වර්ෂ 3 ක් සඳහා වට්ටම් සාධක

| වර්ෂය | 0 | 1 | 2 | 3 |
|---|---|---|---|---|
| වට්ටම් සාධකය | 1 | 0.91 | 0.83 | 0.75 |

**අවශ්‍යවන්නේ :**

(1) 10% වට්ටම් අනුපාතය යටතේ මූලික ආයෝජනයේ වර්තමාන අගය
(2) පළමු වර්ෂයේ ශුද්ධ මෙහෙයුම් මුදල් ප්‍රවාහය
(3) තුන් වන වර්ෂයේ මුදල් ගලාඒම් සහ මුදල් ගලායාම්
(4) 10% වට්ටම් අනුපාතිකය යටතේ ආයෝජනයේ ශුද්ධ වර්තමාන වටිනාකම
(5) 10% වට්ටම් අනුපාතිකය යටතේ ආයෝජනය මූල්‍යමය වශයෙන් ඵලදායී ද යන්න නිර්දේශ කිරීම *(ලකුණු 05 යි)*

(ආ) විවිධ ඇහලුම් නිෂ්පාදනය කරනු ලබන සමාගමක පිරිවැය අයිතම පහත දී ඇත.

(i) උපාංග පිරිවැය
(ii) මහන යන්ත්‍ර ක්ෂය
(iii) කාර්යාල උපකරණ ක්ෂය
(iv) රෙදිවල පිරිවැය
(v) මහන යන්ත්‍ර ක්‍රියාකරුවන්ගේ මාසික වේතන
(vi) තත්ත්ව පාලන පිරිවැය
(vii) විකුණුම් මත ගෙවූ පුරස්කාර
(viii) මහන යන්ත්‍ර සඳහා භාවිත කළ ලිහිසි ද්‍රව්‍ය
(ix) විකුණුම් කොමිස්
(x) ඇහලුම් අපනයනය කිරීමේ නැව් ගාස්තු
(xi) අධ්‍යක්ෂ ගාස්තු

**අවශ්‍යවන්නේ :**

ඉහත එකිනෙක පිරිවැය අයිතමය පහත වර්ගීකරණ යටතේ උචිත කොටුවල (✓) ලකුණ යොදමින් පහත පෙන්වා ඇති පරිදි වෙන්කර දක්වීම (නිෂ්පාදන නොවන පිරිවැය අයිතමයන් 'සෘජු' හෝ 'වක්‍ර' ලෙස වර්ගකිරීම අවශ්‍ය නොවේ.)

| පිරිවැය අයිතම අංකය | සෘජු (D) හෝ වක්‍ර (IND) | | විචල්‍ය (VC) හෝ ස්ථාවර (FC) | | නිෂ්පාදන (M) හෝ නිෂ්පාදන නොවන (NM) | |
|---|---|---|---|---|---|---|
| | D | IND | VC | FC | M | NM |
| උදා : (i) | | ✓ | ✓ | | ✓ | |

*(ලකුණු 05 යි)*
*(මුළු ලකුණු 10 යි)*

***

වාරෙටම ඕන කරන පොත් එකපාර
ඕඩර් කරලා දැන් ගෙදරටම ගෙන්වා ගන්න

LOL Book Store

# 25% OFF ALL BOOKS

Including Exercise Books, CR Books, and B5 Books



ඕනෙම අභ්‍යාස පොතකට 25%ක විශේෂ වට්ටමක්

ORDER BOOKS FROM LOL BOOKS STORE

0372060110 WWW.LOL.LK

071 777 4440 (WhatsApp)

Cash On Delivery Available

# ORDER A/L TERM TEST PAPERS, SHORT NOTES, WORKBOOKS & REVISION BOOKS

SINHALA, ENGLISH & TAMIL MEDIUM



# LOL BOOK STORE

CASH ON DELIVERY AND KOKO PAYMENT AVAILABLE

0717774440 (WHATSAPP)

WWW.LOL.LK